හේලීස් වෙතින් පිදෙන
කිරි නිෂ්පාදකයාගේ අත් පොත



HayVet Laboratory

Hayleys AGRICULTURE
Animal Health Division


ඇන්ටික්
அன்டிக்
ANTICK
cypermethrin 10% (w/v) EC
FOR EXTERNAL USE ONLY

CALUP GEL

ANALGON


Rx ALBENDAZOLE BOLUS (VET.)
ALZOLE BOLUS
ඇල්සෝල් බෝලස්


A Broad Spectrum Anthelmintic for Cattle
WOKAZAN
1 BOLUS
VETOQUINOL INDIA ANIMAL HEALTH PVT. LTD

සම්පාදනය
පශු වෛද්‍ය සුසන්ත මල්ලව ආරච්චි
පශු වෛද්‍ය ඊෂාන් වීරසිංහ
පශු වෛද්‍ය චතුර ප්‍රියදර්ශන
පශු වෛද්‍ය දිනූෂ පෙරේරා

පෙරවදන

දශක තුනක කාලයක් මුළුල්ලේ ශ්‍රී ලාංකීය සත්ව සෞඛ්‍යයට හා නිෂ්පාදනයට අවශ්‍ය ඖෂධ, ආහාර ඌන පූරක හා සේවාවන් සපයමින් ක්ෂේත්‍රයට විශාල සේවයක් ඉටු කරන හේලීස් ඇග්‍රිකල්චර් හෝල්ඩින්ස් ආයතනයේ සත්ව සෞඛ්‍ය අංශය ශ්‍රී ලාංකේය කිරි ගොවීන්ගේ දියුණුව උදෙසා පිරිනමන තවත් තිළිණයක් ලෙස මෙම පොත් පිංච ඔබ වෙත පිරි නමයි.

කිරි ගව පැටවකුගේ උපතේ සිට එම පැටවා මව් දෙනක් බවට පත්ව පැටවකු බිහි කරන අවස්ථාව දක්වා වැදගත් පියවර වලදී ගොවි මහතකුට වැදගත් වන කරුණු සහ සත්ව පාලනයේදී වැදගත් වන කරුණු රැසක් මෙහිදී සාකච්ඡා කෙරේ.

පටුන

	පිටුව
වසු පැටවාගේ උපත	03
උපන් විටම කළ යුතු දේ	04
අලුත උපන් පැටවාගේ පෝෂණය	05
කිරි වැරූ නැම්බි වැස්සිය රැක බලා ගැනීම	10
ගැබ් ගන්වා ගැනීම	11
ගැබ් ගත් දෙන පැටවා බිහි කිරීම	20
වසු පැටවාගේ උපත	23
නව කිරි මුරයක ආරම්භය	27
ගවයන්ට නිතර සෑදෙන රෝග හා ඒවා වළක්වා ගැනීම	29

ගොවියකු මහත් බලාපොරොත්තුවෙන් බලා සිටිනුයේ තම දෙන පැටවකු බිහිකරන තුරුය. ඒ පැටවකු බිහිකරන දෙන නව කිරි මුරයක් ආරම්භ කරන නිසාත්, නව පැටවා (ගැහැණු සතෙකු නම්) අනාගතයේ ගොවියා අතට මුදල් රැගෙන එන නිසාත්ය.

වසු පැටවාගේ උපත

පසු පිටෙක දැක්වෙන වගුව (ඇමුණුම I, 34 පිටුව) භාවිතා කිරීමෙන් ඔබට පැටවා ඉපදීමට අපේක්ෂිත දිනය බලා ගත හැක.

පැටවා බිහි කිරීමට ආසන්න වත්ම මව් දෙනගේ,

- කිරි බුරුල්ල විශාල වී, කිරි වලින් පිරී පාත් වෙයි.
- උකුල් ප්‍රදේශයේ බන්ධනී ලිහිල් වේ.
- උපත් මාර්ගයේ බාහිර අවයව ඉදිමීම, රත්පැහැ වීම හා විස්තාරණය (ලිහිල් වීම) වේ.
- උපත් මාර්ගයෙන් ස්‍රාවයන් ගැලීම ඇරඹේ.
- ආහාර ගැනීම අඩුකරයි / නවතා දමයි.
- වලිගය ඉහලට ඔසවාගෙන සිටීම හා නිතර නිතර මුත්‍රා කරයි.
- අවිවේකී ස්වරූපයක් පෙන්නුම් කරයි.
- නිතර නිතර වාඩිවීමත් හිටගැනීමත් සිදුකරයි.

පැටවාගේ බිහිවීම අදියර 3 කින් දැක්විය හැක.

● පළමු අදියර

ගැබ්ගෙල ලිහිල් වීම, ගර්භාශය සංකෝචනය වීම ඇරඹීම, පැටවා බිහිවන ඉරියව්වට හැරීම හා මවගේ හැසිරීමේ වෙනස්කම් සිදුවන්නේ මේ අදියරේදීය. පැය 02 ත් 06 ත් අතර කාලයක් මේ සඳහා ගතවේ.

● දෙවන අදියර

මව්දෙන තැටමීම, වතුර මල්ල පුපුරා උපත් මාර්ගයෙන් ඉවතට ගැලීම, දෙවන මල්ල පුපුරා ඝන සෙවල වැනි ද්‍රව්‍යක් ගැලීම හා පැටවාගේ බිහිවීම මෙම අදියරේදී සිදුවේ. සාමාන්‍යයෙන් මෙය සිදුවන්නේ පැයක වැනි කාලාන්තරයකදීය.

- **තෙවන අදියර**

වැදෑමහ ඉවත් වීම, තැටමීම නතර කිරීම හා ගර්භාෂයේ සංකෝචනය නතර වීම මෙම කාලයේදී සිදුවේ. පැය 04 දක්වා කාලයක් මේ සඳහා ගතවිය හැක.

උපන් විටම කළ යුතු දේ

ගව පැටවකු බිහි කළ විගසම මව් එළදෙන තම පැටවා ලෙව කමින්, පැටවාගේ සිරුරේ තැවරුණු ශ්ලේෂ්මල ඉවත් කිරීමට පෙළඹේ. මෙමඟින් පැටවාගේ ශ්වසන ක්‍රියාව උත්තේජනය වන අතර මව සමඟ බැඳියාවක් ඇති වේ.

එය එසේ වෙතත්, උපන් විගසම පැටවා පිළිබඳ දැඩි අවධානයක් ඔබ යෙදිය යුතු වේ.

කළ යුතු දේ:

- උපන් විගස නාස් කුහරයේ රැඳී ඇති ශ්ලේෂ්මල ඉවත් කර පැටවාගේ ශ්වසන මාර්ගය පාදා දෙන්න. මෙමඟින් පැටවාට හුස්ම ගැනීම පහසු වනු ඇත.
- පැටවාගේ ශරීරයේ තැවරී ඇති වැදෑමහ කොටස් හා අනෙකුත් ශ්‍රාවයන් පිරිසිදු රෙදි කැබැල්ලක් හෝ වියළි තණකොළ/පිදුරු ආධාරයෙන් පිස දමන්න. පැටවාගේ සිරුරේ උෂ්ණත්වය පහළ යෑම වළක්වා ගැනීමට මෙය ඉතාමත් වැදගත් වේ.
- පැටවා සමඟ සම්බන්ධ වී තිබෙන පෙකනිවැල ශරීරයට අඟල් 2 ක් පමණ දුරින් කපා හරින්න. මේ සඳහා විෂ බීජ හරණය කළ (සර්ජිකල් ස්ප්‍රීට් මඟින්) කතුරක් භාවිතා කරන්න. කපා දැමීමට පෙර ශරීරය දෙසින් පෙකනි වැල නයිලෝන් පටකින් තද කර බඳින්න (1 රූපය බලන්න.)



1 රූපය

- පෙකනිවැල කපා දැමීමෙන් ඇති වන තුවාලය පැසවීම හා ඉහඳ පණුවන් ඇති වීම වළකා ගැනීමට පොවිඩෝන් අයඩින් හා සර්ජිකල් ස්ප්‍රිට් 1:1 අනුපාතයට මිශ්‍ර කළ ද්‍රාවණයකින් පොඟවන්න.
- උපත සිදු වූ ස්ථානයේ ඇති සියළුම වැදෑමහ කොටස් හා අනෙකුත් අපවිත්‍ර ද්‍රව්‍යය ගාලෙන් ඉවත් කර බිම වළලා දමන්න.
- එසේ වළ දමන ස්ථානයේ මතු ප්‍රයෝජනය සඳහා යම්කිසි ගසක් රෝපණය කරන්න.
- පැටවාගේ උපත් බර සටහන් කර ගන්න. මෙය ඉතාමත් ප්‍රයෝජනවත් වේ.

ඉපදී පළමු පැය භාගය තුළ පැටවා තනිවම නැගී සිටීමට උත්සාහ කරන අතර මවගෙන් කිරි උරා බීම අරඹයි. එසේ නොකරන දුර්වල පැටවාට නැගී සිටීමට හා මුල් කිරි උරා බීමට ඔබ උදව් කළ යුතු වේ.

අලුත උපන් පැටවාගේ පෝෂණය

කොලස්ට්‍රම් (Colostrum) හෙවත් මුල් කිරි

අළුත උපත් පැටවාට ඇති ප්‍රබලම අභියෝගය රෝග වලින් ආරක්ෂා වීමයි. කොලස්ට්‍රම් යනු ඒ අභියෝගය ජය ගැනීමේ මගයි. ඉපදී මුල් පැය 1/2 - 1 ත් ඇතුළත මුල් කිරි බීම ඇරඹිය යුතුය.

කොලස්ට්‍රම් වල ගුණාංග

- පරිසරයේ ඇති රෝග කාරක විෂ බීජ වලින් ආරක්ෂා වීමට අවශ්‍ය ප්‍රතිශක්තිය (ප්‍රතිදේහ) අඩංගු වීම.
- පැටවාට ඉතාමත් පහසුවෙන් ජීරණය කළ හැකි වීම.
- සාමාන්‍ය එළකිරි වලට වඩා 4,5 ගුණයකින් වැඩි ප්‍රෝටීන් ප්‍රමාණයක් තිබීම.
- පැටවාට අවශ්‍ය ඛනිජ ලවණ හා විටමින් වලින් පරිපූර්ණ වීම.
- පැටවාගේ ආහාර මාර්ගයේ අනවශ්‍ය ශ්ලේෂ්මල ඉවත් කිරීමේ හැකියාව.
- ඉතාමත් පහසුවෙන් පැටවාගේ ආහාර මාර්ගය හරහා ශරීරයට උරා ගැනීමේ හැකියාව.

මේ හේතු නිසාම කොලස්ට්‍රම්, ඉපදී මුල් පැය කිහිපය තුළ පැටවාට ලැබීම අතිශය වැදගත් වේ. ඒ නිසාම උපත් බරින් 10% පමණ ප්‍රමාණයක් මුල් දින 3-4 පුරා ලබා දීම කළ යුතු වේ. ඒ සඳහා දිනකට කිහිපවතාවක්ම පැටවාට මවගෙන් කිරි උරා බීමට සැලැස්වීම කළ හැකිය. දෙනගේ කිරි බුරුල්ල පිරිසිදු කිරීම කිරි බීමට පෙර සිදු කරන්නේ නම් වඩාත් සුදුසුය. ඔබ බෝතල් ආධාරයෙන් සූප්පුවක් භාවිතා කර කිරි පෙවීම කරන්නේ නම්,

- කිරි පෙවීමට පෙර හා පසු එම භාජන අනිවාර්යයෙන්ම පිරිසිදු කරන්න.
- කිසි විටෙක අවස්ථා 2කදී දොවාගත් කිරි එකට මිශ්‍ර නොකරන්න.
- කලින් දොවාගෙන ශීතකරණයේ තැබූ කිරි නම්, ශරීර උෂ්ණත්වයට උණුසුම් කර පොවන්න. (100-102 °F)
- පමණ දැන කිරි පෙවීමත්, නිසි උෂ්ණත්වයේ කිරි ලබා දීමත් නොකළහොත් පැටවාට බඩ යෑම වැනි රෝග ඇති විය හැක.

අවාසනාවන්ත ලෙස මව මිය ගියේ නම් එවැනි පැටවකුට මුල් කිරි ලබා දීම සඳහා ඊට ඉතා ආසන්න දිනක පැටවකු බිහි කළ දෙනකගේ කිරි ලබා දෙන්න. එවැනි දෙනක් නොමැති විටක,

- සාමාන්‍ය එළකිරි 850ml
- බිත්තර සුදු මද 6 ක්
- එඩරු තෙල් 5ml
- මෝර තෙල් 5ml
- ප්‍රතිජීවක 5ml
- උණුකර නිවාගත් පිරිසිදු ජලය 300ml

එකට මිශ්‍ර කර අලුත උපන් පැටවාට ලබා දෙන්න.

පළමු සතියේ පෝෂණය

මෙම කාලය තුළදීත් පැටවාට ලබා දිය යුතු හොඳම ආහාරය වන්නේ දෙනගේ මව් කිරිමයි. එබැවින් පැටවාගේ ශරීර බරින් 10% ක ප්‍රමාණයක කිරි දිනකට 3 හෝ 4 වතාවක් ලබා දීම මෙම කාලය තුළ දී කළ යුතු වේ.

පළමු මාසය

දේහ බරින් 10% ක කිරි ප්‍රමාණය දිගටම ලබා දිය යුතු අතර එය දිනකට දෙවතාවකට පමණක් සීමා කරන්න. එසේම රූමනයේ වර්ධනය උත්තේජනය කිරීම සඳහා දින 4 දීම සාන්ද්‍ර ආහාර අරඹන්න. මේ සඳහා ගව පැටවුන් සඳහාම සකසන සුවිශේෂිත ආරම්භක ආහාර (calf starter) ඉතා යෝග්‍ය වේ. තණ කොළ කෑම තවත් ප්‍රමාද කරන්න. මී ගව පැටවකු නම් සති 2 අවසානයේ පණුහරණය කරන්න (පණු පෙති දෙන්න). එළ ගව පැටවා පණුහරණය කළ යුත්තේ ඉපදී පළමු මාසය අවසන් වත්මය.

දෙවන මාසය

මාස දෙක අවසානවත්ම කිරි වැරීම ඉලක්ක කරගෙන පැටවා පෝෂණය කළ යුතු වේ. මේ සඳහා ක්‍රමානුකූලව කිරි ලබාදීම අඩුකළ යුතු අතර, ලබාදෙන සාන්ද්‍ර ආහාර ප්‍රමාණය ක්‍රමානුකූලව වැඩි කළ යුතුය. ඇතිතරම් ජලය ලබාදිය යුතු අතර නූතන සොයා ගැනීම් වලට අනුව තණ කොළ හෝ සයිලේජ හඳුන්වාදීම නොකළ යුතුයි.

කිරි වැරීම

උපත් බර මෙන් දෙගුණයක් නැතහොත් වැඩුණු සතකුගේ බරින් 12% ක දේහ බරක් ලඟා කරගත් පැටවා කිරි වැරීමට සුදුසුය. මේ සඳහා මසකට වරක්වත් බර සටහන් කර ගැනීම ඉතා වැදගත් වේ. කිරි වරන අවස්ථාව වන විට පැටවා මුළුමනින්ම කිරි වලින් තොරව යැපීමට හැකියාව උදා කරගෙන තිබිය යුතු අතර දිනකට සාන්ද්‍ර ආහාර 750g-1kg පමණ කෑමට හැකියාව ලබා තිබිය යුතු වේ.

- නූතන සොයා ගැනීම් අනුව තණ කොළ හඳුන්වා දිය යුත්තේ මෙම අවස්ථාවේදීය.

ගව පැටවා මවගෙන් කිරි උරා බීමට සැලැස්වීම

ඉතාමත් පහසුම හා ප්‍රායෝගික ක්‍රමයයි. වාසි මෙන්ම අවාසි ද කිහිපයක් මෙම ක්‍රමයේ ඇත.

ශ්‍රමය වැය වීමකින් තොරවම ආරක්ෂිතව පැටවාට මෙම ක්‍රමය මගින් කිරි ලබා දීමට හැකියාව ලැබේ. එසේම අතින් කිරි දෙවීමෙන් දෙවිය නොහැකිව කිරි බුරුල්ලේ ඉතිරිවන 20% ක් පමණ වන කිරි ප්‍රමාණය පැටවාට බීමට සැළැස්විය හැකි වීම වාසි දායකය. එසේම මෙම ක්‍රමයේදී පැටවාට ප්‍රමාණවත් කිරි ප්‍රමාණයක් ලැබෙන බවට ගොවියා විසින් තහවුරු කළ යුතු වේ.

උදාහරණයක් ගෙන සලකා බලමු.
පැටවාගේ බර 25kg යැයි සැලකුවහොත්,
10% කිරි අවශ්‍ය නම්, 2.5 L අවශ්‍යයි.
දෙනගෙන් දෙවිය හැකි කිරි ප්‍රමාණය 4 L නම්,
බුරුල්ලේ ඉතිරිවන 20% ප්‍රමාණය 1 L වේ. (80% ක් යනු 4 L නම්, 20% ක් යනු 1 L වේ)
එක් පුඩුවකින් දෙවීමෙන් ලැබෙන කිරි ප්‍රමාණය 1 L වේ. (එකකින් ලීටර 1 බැගින් පුඩු 4 න් ලීටර 4 යි)
දෙවීමෙන් තොරව ඉතිරි කළ යුතු කිරි ප්‍රමාණය 1.5 L වේ. (අවශ්‍ය ලීටර් 2.5 - දෙවීමට නොහැකි ලීටර 1)
කිරි නොදොවා ඉතිරි කළ යුතු පුඩු ගණන 1.5 (එක් පුඩුවකින් ලීටර 1 බැවින්, ලීටර 1.5 ගැනීමට)

ඒ අනුව එක් පුඩුවක් සම්පූර්ණයෙන්ම ද තවත් පුඩුවක් අර්ධ වශයෙන් ද කිරි නොදොවා ඉතිරි කිරීමෙන් පැටවාට ප්‍රමාණවත් කිරි ප්‍රමාණයක් ඉතිරි කළ හැකිය. (ඉතිරි කළ යුතු පුඩු ගණන තීරණය වන්නේ මව් දෙනගේ කිරි නිෂ්පාදනය මතයි. මෙහි දක්වා ඇත්තේ උදාහරණයක් පමණි. ඔබගේ දෙනගේ කිරි නිෂ්පාදනය අනුව ගණනය කර ගන්න.)

පැටවා මවගෙන් කිරි උරා බීමේ අවාසි

- පාලනයකින් තොරව කිරි උරා බීම නිසා පැටවා රෝගී විය හැක.
- පැටවාට ලැබෙන කිරි ප්‍රමාණය මැනිය නොහැකි නිසා අඩු කිරි ප්‍රමාණයක් ලැබීමෙන් පැටවා දුර්වල විය හැකිය.
- පැටවා කිරි උරා බොන විට කිරි එරීමට හුරුවන දෙන පැටවා නැති විටක කිරි සැඟවීමට පෙළඹීමෙන් කිරි දෙවීම අපහසු වේ.

- විවිධ හේතූන් මත දෛනික කිරි නිෂ්පාදන ප්‍රමාණය අඩු වැඩි වන බැවින් කිරි නිෂ්පාදනය අඩු දින වලදී පැටවාට ප්‍රමාණවත් කිරි ප්‍රමාණයක් නොලැබී යාමට හැක.
- තවද පැටවා කිරි උරා බීම නිසා නිසි කලට මව් දෙන නැවත පට්ටි ලකුණු පළ කිරීම සිදු නොවී ප්‍රමාද වීම සිදු වේ.

සූප්පු/භාජන මගින් කෘතිමව කිරි පෙවීම

මෙම ක්‍රමයේදී පැටවා මවගෙන් වෙන් කර දෛනිකව අවශ්‍ය කිරි ප්‍රමාණය ලබා දේ. එමගින් පැටවාගේ දේහ බරට අවශ්‍ය කිරි ප්‍රමාණය නිවැරදිවම ලබා දීමට හැකියාව ලැබේ. පැටවා මවගෙන් වෙන් කිරීම උපන් විගසම හෝ මුල් කිරි දී දින 4 දී සිදු කළ හැක.

මෙම ක්‍රමයේදී;

- කලින් දොවා ශීත කළ කිරි නම් ශරීර උෂ්ණත්වයට (100-102 °F) රත් කර ලබා දිය යුතු වේ.
- භාවිතා කරන උපකරණ සියල්ල කිරි පෙවීමට පෙර හා පසු පිරිසිදු කිරීම අනිවාර්ය වේ.
- පැටවාගේ හිස ඉහළට එසවෙන ආකාරයට කිරි පෙවීම කළ යුතු අතර පැටවා මේ සඳහා හුරු කළ යුතු වේ.
- මෙමගින් පැටවා කිරි වැරීම නිසි කලම කළ හැකි වේ.

2 රූපය

කෘතිම කිරි පෙවීමේ අවාසි

- ශ්‍රමය වැය වන වියදම්කාරී කටයුත්තකි.
- අපවිත්‍ර වීම මඟින් පැටවාට විවිධ රෝග ඇති විය හැක.
- නිසි ක්‍රමයට (හිස ඉහළට එසවෙන පරිදි) පෙවීම නොකිරීමෙන් ජීරණ ප්‍රශ්න මතු විය හැක.

3 රූපය

කිරි වැරූ නැම්බි වැස්සිය රැක බලා ගැනීම

කිරි වැරූ අවස්ථාවේ සිට පළමු පට්ටි ලකුණු පෙන්වන අවස්ථාව දක්වා කාලය වැස්සි පැටවා ඉතා හොඳින් පෝෂණය කිරීම වඩාත් වැදගත් වන්නේ ඔබගේ ගොවිපලේ අනාගත ආදායම රැගෙන එන්නේ ඇය බැවිනි. නිසි ලෙස පෝෂණය වූ නැම්බි වැස්සිය කලට වේලාවට පට්ටිය පැමිණ, ගැබ් ගෙන නීරෝගී පැටවුන් බිහි කර ප්‍රශස්ථ කිරි නිෂ්පාදනයක් ලබා දෙයි.

ඒ සඳහා පසු පිටෙක (ඇමුණුම II ,35 පිටුව) දැක්වෙන දළ සටහන ප්‍රයෝජනයට ගත හැකිය.

ලබා දෙන පෝෂණය ප්‍රමාණවත්ව ලැබෙන්නේ දැයි තහවුරු කරගැනීම සඳහා දේහ තත්ත්ව ලකුණු (Body Condition Score - BCS) ක්‍රමය (ඇමුණුම III , 36 පිටුව) හා දේහ බරෙහි වැඩි වීම ප්‍රයෝජනයට ගත හැක. මේ සඳහා අවම වශයෙන් මාසිකව බර කිරීම කළ යුතු වේ. බර කිරීම සඳහා තරාදි අවශ්‍ය නොවන අතර පහත සඳහන් රූපයේ දැක්වෙන පරිදි බඳ වටා දිග මානීමේ ක්‍රමය (බර කිරන පටිය) උපයෝගී කර ගත හැකිය. (බඳ වටා දිගට අදාල බර දැන ගැනීම සඳහා ඇමුණුම VI, 43 පිටුව බලන්න.)

4 රූපය

ශීත කලාප වල වැඩෙන උසස් ආරයේ යුරෝපීය දෙනුන් මෙම කාලයේදී දළ වශයෙන් දිනකට 450-500g ක් පමණ බරින් වැඩි වේ. ඒ අනුව මසකට 15Kg ක් පමණ බරින් වැඩේ. (මෙය සත්ව වර්ගය හා කලාපය අනුව වෙනස් වේ.)

නිවැරදි පෝෂණය මෙන්ම නිවැරදි පණුහරණය ද මෙම කාලය තුළ දී ඉතාමත් වැදගත් වේ. ඒ සඳහා පසු පිටෙක දැක්වෙන වගුව (ඇමුණුම IV, 39 පිටුව) උපයෝගී කර ගත හැක.

ගැබ් ගන්වා ගැනීම

ලිංගික පරිණතිය

ලබා දෙන පෝෂණය, සත්ව පාලන ක්‍රමවේදය, පරිසරය මෙන්ම සත්ව වර්ගයේ ජානමය හැකියාව අනුව ලිංගික පරිණතිය (පළමු වරට පට්ටියට පැමිණීම) ළඟා වන වයස වෙනස් විය හැක. දළ වශයෙන් මාස 18 කදී ලිංගික පරිණතිය ළඟා කර ගත යුතුය. තම සත්ව වර්ගයේ වැඩුණු සතෙකුගේ දේහ බරින් 2/3 ක බරක් ලබා ගන්නා වැස්සි පැටවා ලිංගික පරිණතිය ලබයි.

ප්‍රථම පට්ටි ලකුණු පෙන්නූ දින සිට සෑම දින 21-22 ක කාලයකදී නැවත නැවත පට්ටියට පැමිණේ. හැම විටම ප්‍රථමයෙන් පට්ටි ලකුණු පළ කළ අවස්ථාව මඟ හැර ගැබ් ගැන්වීම කළ යුතු අතර නිසි දේහ බර ළඟා වී නොමැති විටක නිසි බර ලඟා කර ගන්නාතුරු ගැබ් ගැන්වීම නොකළ යුතුයි.

ගැබ් ගැන්වීමට සුදුසු දේහ බර දළ වශයෙන්

ෆ්‍රීෂියන් / ෆ්‍රීෂියන් ක්‍රොස්	-	300 Kg
අයර්ශයර්/සහිවාල් /ෆ්‍රීෂියන් x දේශීය ක්‍රොස්	-	275 Kg
ජර්සි/ජර්සි ක්‍රොස්	-	250 Kg

පට්ටි ලකුණු හඳුනා ගැනීම

පට්ටි ලකුණු නිසි පරිදි හඳුනා නොගැනීම ආර්ථික අවාසි රැසකට හේතු වේ. එක් අවස්ථාවක් මඟහැරුණහොත් නැවත දින 21-22 කාලය අපතේ යෑම වැළැක්විය නොහැක. ප්‍රථම පැටවා ප්‍රමාද වීම, පැටවුන් දෙදෙනෙකු අතර පරතරය වැඩි වීම හා එමඟින් කිරි මුර මඟ හැරීම විශාල ආර්ථික අවාසියකි.

එබැවින් වැස්සියගේ කෑ ගැසීමට අමතරව ඇති අනෙකුත් පට්ටි ලකුණු පිළිබඳ දැනුවත් වී පට්ටි අවස්ථාව නිසි පරිදි හඳුනා ගැනීම ඉතාමත් ප්‍රයෝජනවත් වේ.

පට්ටි ලකුණු / මඳ ලකෂණ

- වෙනත් වැස්සියකට තම පිට මත නැගීමට ඉඩ හැරීම.
- වෙනත් දෙනකගේ පිට මත නැගීමට උත්සාහ කිරීම.
- උපත් මාර්ගයේ අවසන බාහිර ලින්ගේන්ද්‍රිය (Vulva) රෝස පැහැ වී, ඉදිමී තෙත් වීම.

5 රූපය

- උපත් මාර්ගයේ පැහැදිලි ශ්‍රාවයක් ගැලීම හා මෙම ශ්‍රාවය උකු, නූලක් මෙන් දිගට එල්ලී තිබීම. වලිගය ගැසීම නිසා මෙම අවර්ණ උකු ශ්‍රාවය පාද වල හා වලිගයේ තැවරී තිබිය හැක.

6 රූපය

- දෙන තරමක කලබලකාරී ගතියක් හා අවිවේකී ගතියක් පෙන්වීම.
- නිතර නිතර මුත්‍රා පිට කිරීම.
- නිතර හඬ නැගීම.
- වලිගය තරමක් ඔසවා ගෙන සිටීම.
- ආහාර ගැනීමට ඇති උනන්දුව අඩු වීම.
- කිරි ගන්නා දෙනකගේ නම් කිරි නිෂ්පාදනයේ අඩුවක් සිදු වීම.

ඇතැම් සතුන් මේ සියළු ලක්‍ෂණ පෙන්වන අතර ඇතැම් දෙනුන් කිහි-පයක් පමණක් පෙන්වයි.

පට්ටි ලකුණු හරි හැටි හඳුනා ගැනීම ඉතාමත් වැදගත් වන්නේ, කෘතිම සිංචනය කළ යුතු නිවැරදිම වේලාව හඳුනා ගැනීමටයි. කලින් සිදු කරන සිංචනයත් ප්‍රමාද වී කරන සිංචනයත් අසාර්ථක වීමට වැඩි ඉඩකඩක් ඇති බැවින් ඉන් කාලයත්, මුදලත් නාස්ති වේ.

නීතියක් වශයෙන් පට්ටි ලකුණු පහළ වී පැය 12 කින් කෘතිම සිංචනය සිදු කරනු ලැබේ. ඒ අනුව උදේ වරුවේ පට්ටි ලකුණු පෙන්වන දෙනකට එදිනම සවස් වරුවේ ද, සවස් වරුවේ පට්ටියට එන සතුන් පසු දා උදෑසන ද සිංචනය කරනු ලැබේ.

එබැවින් දිනකට දෙවතාවක් (උදෑසන/සවස) තම දෙනුන් කෙරෙහි විශේෂ අවධානයකින් පට්ටි ලකුණු අධ්‍යයනය කිරීම ඉතාමත් ප්‍රයෝජනවත් වේ. විශේෂයෙන්ම මී ගව දෙන සවස් හා රාත්‍රී කාලයේ පට්ටි ලකුණු පෙන්වන බැවින් එම කාලයේ විශේෂ අවධානයක් යොමු කිරීම ඉතාමත් වැදගත් වේ.

නිසි කාලය එළඹියත්, නිසි දේහ බර ඇතත් ප්‍රථම වරට පට්ටියට පැමිණීමට ඇතැම් විට වැස්සි නැම්බියන් ප්‍රමාද විය හැක. එවැනි නැම්බියන්ට දිනකට බෙස්ට්මින් ගෝල්ඩ් (Bestmin Gold) ග්‍රෑම් 30 ක් බැගින් (මේස හැඳි 2 ක්) දින 40 ක් (1.2 Kg) ලබා දීමෙන් පට්ටියට ගෙන්වා ගැනීමට හැකියාව ලැබේ.

කලින් පැටවුන් බිහි කර ඇති වැස්සියන්ට ද පට්ටි ලකුණු පහළ කිරීමේ ප්‍රමාදයක් හෝ කරන සිංචනය සාර්ථක නොවන අවස්ථාවන්හීදි දිනකට Bestmin Gold 30g බැගින් දිනපතා, දින 40 ක් ලබා දීමෙන් සාර්ථක ප්‍රතිඵල ලඟා කර ගත හැක.

මෙම ක්‍රමයද සාර්ථක නොවන්නේ නම් ඔබගේ පශු වෛද්‍යවරයාගෙන් උපදෙස් හා ප්‍රතිකාර ලබා ගන්න.

ගැබ් ගැන්වීම

පට්ටියට පැමිණි දෙන ස්වභාවික ක්‍රමයට ගොනෙකු මාර්ගයෙන් හෝ කෘතිම සිංචනය (Artificial Insemination / AI) මඟින් ගැබ් ගැන්විය හැක. එහෙත් කෘතිම සිංචනයේ ඇති වාසි රැස නිසා රජය මඟින් කෘතිම සිංචනය ප්‍රචලිත කිරීමට කටයුතු කර ඇති අතර මේ වන විට ගොවියන් විශාල වශයෙන් මෙම ක්‍රමයට අනුගත වී ඇත.

ප්‍රථම වරට පට්ටි ලකුණු පෙන් වූ නැම්බිය එම අවස්ථාවේම ගැබ් ගැන්වීමට උත්සාහ නොකළ යුතුයි. දෙවන පට්ටියට ගැබ් ගැන්වීම කළ යුතුය. එබැවින් පළමු පට්ටි ලකුණු පෙන් වූ දෙන කෙරෙහි එතැන් පටන් දින 20 සිට විශේෂ අවධානයකින් සිටිය යුතු වේ.

පට්ටියට ආසන්න / පට්ටියට පැමිණි / ගැබ් ගැන්වීමට අපේක්ෂිත දෙන කිසි විටෙක තද හිරු රශ්මිය ඇති ස්ථානයක තැබීම නොකළ යුතුය. ගව ගාලේ හෝ හොඳට සෙවන ඇති ස්ථානයක දෙන ගැට ගැසිය යුතු අතර කෑම හා වතුර ඇති පදමට ලබා දිය යුතුයි. සෙවන මෙන්ම කලබලකාරී නොවන නිස්කලංක පරිසරයක දී සිදු කරන සිංචනය සාර්ථක වීමේ වැඩි ඉඩකඩක් ඇත.

කෘතිම සිංචනය සිදු කිරීමෙන් අනතුරුවත් දෙන එවැනිම පරිසරයක හොඳින් පෝෂණය සිදු කිරීම ඉතාමත් යෝග්‍ය වේ. එසේ නොකර පසුව වෙනත් අයට දෝෂාරෝපණය කළත්, දෝෂාරෝපණය නිසා දෙන ගැබ් ගන්නේ නැත.

සිංචනය සාර්ථක වූයේ නම් නැවත දින 21 කදී දෙන පට්ටි ලකුණු නොපෙන්වනු ඇත. එය ඇය ගැබ් ගෙන ඇති බවට දෙන ප්‍රථම ඉඟියයි. කෙසේ වෙතත් කෘතිම සිංචනය කළ දිනයේ සිට දින 60-90 කින් පශු වෛද්‍යවරයා ලවා ගැබ් පරීක්ෂාවක් සිදු කර තහවුරු කර ගැනීම ඉතා වැදගත් වේ. මන්ද යත් ඇතැම් විට පට්ටි ලකුණු පහළ වීම නතර වන්නේ වෙනත් හේතුවක් නිසා වීමට ද ඉඩ ඇති බැවිනි. එම නිසා ගැබ් පරීක්ෂාවකින් තහවුරු නොවුන විටකදී හැකි ඉක්මනින් ගැටළුවට නිසි ක්‍රියාමාර්ග ගැනීමට අවස්ථාව සැලසේ. එසේ නොකිරීමෙන් කාලය මෙන්ම, සංකූලතා ඇති වීමෙන් දෙන නැවත කිසි දිනක ගැබ් ගැනීමට නොහැකි වීමේ අවධානමක් ඇති විය හැක.

ගර්භනී කාලය

එළදෙනගේ ගර්භනී කාලය සාමාන්‍ය වශයෙන් දින 280 ක් ද මී ගව දෙනකගේ ගැබ් කාලය දින 310 ක් ද වේ. මෙම කාලය දින 270-295 දක්වා එළදෙනකගේ ද, දින 300- 330 දක්වා මී ගව දෙනකගේ ද වශයෙන් වෙනස් විය හැක.

මෙම කාලය තුළ දෙනගේ පෝෂණ අවශ්‍යතාවය ඉතාමත් ඉහළ අගයක් ගනී. මුල් වරට ගැබ් ගත් නැම්බියක් නම්, ඇයට තම ශරීරය පවත්වා ගෙන යාමට, තම ශරීරයේ වර්ධනයට, පැටවාගේ වර්ධනයට යන සියළු කාරණා සඳහා පෝෂණය අවශ්‍ය වේ. මෙය ගැබ් නොගත් අවස්ථාවේ පෝෂණ අවශ්‍යතාවයට වඩා ඉතා ඉහළ අගයක් ගනී. එසේම ගැබ් කාලයේ අවසාන මාස 2 කදී දෙනගේ පෝෂණ අවශ්‍යතාව ඉතාමත් ඉහළ අගයක් ගන්නේ ගර්භයේ වර්ධන වේගය සීඝ්‍රයෙන් ඉහළ යාම නිසාය.

මාස 7 දී ගර්භයේ බර 10Kg කින් වැඩි වේ.
මාස 8 දී ගර්භයේ බර 20Kg කින් වැඩි වේ.
මාස 9 දී ගර්භයේ බර 35Kg කින් වැඩි වේ.

මෙම කාලයේදී දෙනගේ පෝෂණය නිසි බරින් යුතු නිරෝගී පැටවකුගේ බිහිවීමටත්, ඇයගෙන් ඉහළ කිරි නිෂ්පාදනයක් දිගු කාලයක් ලබා ගැනීමටත් ඉවහල් වේ.

කිරි දෙන දෙනක් ගැබ් ගෙන සිටින අවස්ථාවේ ද ඉහළ පෝෂණ අවශ්‍යතාවයක් ඇත. ශරීරය පවත්වාගෙන යාමට, කිරි නිපදවීමට හා ගර්භයේ වර්ධනයට අවශ්‍ය පෝෂණය ලැබීම ඉතාමත් අත්‍යවශ්‍ය කාරණයකි.

ගැබ් ගත් දෙනගේ පෝෂණය

දෙනක් ගැබ් ගෙන සිටින විටෙක පෝෂණ අවශ්‍යතාවය ඉතාමත් ඉහළ බැවින් ශක්තිය වැය වන අවස්ථා අවම වන පරිදි සත්ව පාලනයේ යෙදීම ඉතාමත් වැදගත් වේ.

වෙනදා මෙන් එලිමහනේ උලා කෑම අරිනවා වෙනුවට, ගව ගාලක තබා ගෙන පෝෂණය කිරීම වඩාත් උචිත වේ. එමඟින් අව්වෙන් වැස්සෙන් විඩාවට පත්වීම, ඇවිදිමින් උලා කෑමට ශක්තිය වැයවීම වැනි අහිතකර කාරණා වලින් දෙන ආරක්ෂා කර ගැනීමට ලැබේ.

ගාලක ඇති කරන ගැබ් ගත් දෙනට නිරතුරුවම ආහාර හා ජලය සැපයීම සිදු කිරීම අනිවාර්ය වේ. ලබා දෙන ආහාර දෙනගේ පෝෂණ අවශ්‍යතාව සැපිරිය හැකි වන පරිදි ඉහළ පෝෂණ අගයකින් යුතු වීම ඉතාමත් වැදගත් වේ.

ගැබ් කාලයේ පෝෂණය

ඉහළ පෝෂණයක් සඳහා වඩාත් සුදුසු පෝෂක ද්‍රව්‍ය තෝරා ගමු.

- වෙනදා ලබා දුන් වල් තණ කොළ වෙනුවට - CO3 වැනි වගා කළ උසස් තෘණ භාවිතා කරමු.
- දෛනික ආහාර ප්‍රමාණයෙන් 1/3 ක් රනිල බෝග වලින් සපයා ගනිමු. උදා: ග්ලිරිසීඩියා, ඉපිල්, මුරුංගා, එරබදු, කැලියෙන්ඩ්‍රා, පෝර වැල්, සෙටේරියා
- නිපදවන සෑම කිරි ලීටර් 1 කට ග්‍රෑම් 500 ක් වන පරිදි සාන්ද්‍ර ආහාර එක් කරමු.
- උසස් සංයුතියකින් යුත් ඛණිජ සමඟ අවශ්‍ය විටමින් ප්‍රමාණය දෛනිකව ලබා දෙමු.

දෙනක් තම දේහ බරින් 10% ක් පමණ ආහාර ප්‍රමාණයක් තෙත ශාකමය ආහාර ආහාරයට ගන්නා බව සැලකුවහොත්, 350Kg බර දෙනකට දිනකට 35Kg ක් පමණ රළු ආහාර අවශ්‍ය වේ.

එම අවශ්‍යතාවයෙන් 2/3 ක්, එනම් ආසන්න වශයෙන් 24Kg ක්, උසස් ආරයේ වගා කළ තණකොළ (CO3) ලබා දීම කළ යුතුයි. මේ සඳහා CO3 වගා කිරීමට ගොවිමහතුන් පෙළඹිය යුතු අතර එය එතරම් අපහසු කටයුත්තක් නොවේ. අවශ්‍ය තරමට CO3 ලබා දීමට නොහැකි විටක හැකි උපරිමය ඉන් ලබා දී මදි වන ප්‍රමාණය සාමාන්‍ය තණකොළ ලබා දෙන්න.

ඉතිරි 1/3 ක්, එනම් 12Kg ප්‍රමාණය රනිල වර්ගයේ ගස් අතු, වැල් වලින් සම්පූර්ණ කරන්න. මේ සඳහා පෝර වැල්, පෝර ගස් අතු, ඉපිල් ඉපිල්, එරබදු වැනි ගස් අතු වැල් වර්ග භාවිතා කළ හැක. මතක තබා ගත යුතු වැදගත්ම කාරණාව වන්නේ එම ගස් අතු වැල් වර්ග මිශ්‍රණයක් ලෙස ලබා දීමයි. මන්ද යත් එකම වර්ගයකින් ලබා දීම නුසුදුසු බැවිනි.

ගැබ් ගත් දෙනගේ පෝෂණ අවශ්‍යතාව ඉතාමත් ඉහළ බැවින් ලබා දෙන සාන්ද්‍ර ආහාර ප්‍රමාණය ද තරමක් වැඩි කිරීම වැදගත් වේ. ඒ අනුව නිපදවන සෑම කිරි ලීටරයක් සඳහාම සාන්ද්‍ර ආහාර 500 g ක් වත් එක් කළ යුතු වේ. මේ සඳහා පොල් පුන්නක්කු, හාල් කුඩු, ගව ආහාර වැනි දෑ භාවිතා කළ හැක.

එසේම ඛණිජ හා විටමින් අවශ්‍යතාවය නිසි පරිදි සැපයීම ඉතාමත් වැදගත් වේ. වෙළඳපොලහි තිබෙන බොහෝමයක් ඛණිජ මිශ්‍රණ වල අවශ්‍ය විටමින් ප්‍රමාණය අඩංගු නොවන බැවින් ඒ පිළිබඳ සැලකිලිමත් වීම ඉතා වැදගත් වේ. නිෂ්පාදකයා විසින් නිර්දේශිත ප්‍රමාණයෙන්ම ඛණිජ ලබා දිය යුතු වේ. ප්‍රමාණයට වඩා අඩුවෙන් ලබා දීමෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි වේ.

කලින් සඳහන් කළ පරිදි ගර්භයේ වැඩීමත් සමගම අවසාන මාස 2, 3 දී දෙනගේ පෝෂණ අවශ්‍යතාව සීඝ්‍ර ලෙස ඉහළ යයි. එසේම ගර්භයේ ප්‍රමාණයේ සිදුවන සීඝ්‍ර වර්ධනය නිසා රුමනය තෙරපීමෙන් කෑම ගැනීමේ අපහසුතාවක් ද ඇති වේ. එබැවින් අවසාන මාස 2 යනු ඉතා ඉහළ පෝෂණ අවශ්‍යතාවයක් ඇතත් එම මුළු අවශ්‍යතාවය සැපයීම ඉතාමත් අපහසු කාලයකි. එබැවින් දෙනගේ පෝෂණ අවශ්‍යතාවය අඩු කිරීම තුළින් ඇය වැහැරීමට නොදී පැටවා රැක ගැනීමට ක්‍රියා කළ යුතු වේ. ඇගේ පෝෂණ අවශ්‍යතාවය අඩු කිරීමේ පහසුම මග කිරි දෙවීම නතර කිරීමයි.

කිරි දෙවීම නතර කිරීම තුළින්,

- දෙනගේ පෝෂණ අවශ්‍යතාවල සම්පූර්ණ කළ හැකි මට්ටමක පවත්වා ගැනීමට හැකි වීමෙන්
    - නීරෝගී පැටවකු ලබා ගැනීම.
    - ප්‍රමාද නොවී නැවත පට්ටියට පැමිණීම.
    - ඉතා ඉහළ නිෂ්පාදනයක් සහිත කිරි මුරයක් ඇරඹීම කළ හැකි වේ.

- කිරි නිපදවන අවයවය වන කිරි බුරුල්ලට මාස 2 ක විවේකී කාලයක් ලැබීම තුළින් පටක අළුත්වැඩියා කර ගෙන ඊළඟ කිරි මුරයට සූදානම් වීමට අවස්ථාව සැලසේ. මෙමගින් බුරුල්ලේ රෝග නිසා අඩපණ වූ නිෂ්පාදනය ඇතැම් විට යතා තත්වයට පත් කර ගත හැකිය.

- දෙනගේ වැහැරී යන දේහය ප්‍රශස්ථ මට්ටමේ පවත්වා ගෙන යාමට අවස්ථාව ලැබීම.

ගර්භයේ වැඩීමත් සමඟම රූමනය තෙරපීම නිසා දෙනට පෙරදී මෙන් ආහාර ප්‍රමාණයක් කෑමට නොහැකි වීම ඉතාමත් අවාසිදායක තත්වයකි. සාමාන්‍යයෙන් රූමනයේ පවතින ආහාර ඉන්පසු පසට ගලා යන්නේ හොඳින් ජීරණය වූ පසුවයි. රූමනයේ පවතින්නේ ජීරණයට අපහසු තන්තු නම් ඒවා වැඩි කාලයක් එහිම රැඳී තිබී තවදුරටත් ආහාර ගැනීමට නොහැකි තත්වයක් ඇති වේ. රූමනයේ ඇති තන්තු ඉක්මනින් හොඳින් ජීර්ණය වුවහොත් ඒවා ඉක්මනින් පසු පසට ගලා යාමෙන් රූමනය හිස් වේ. එවිට දෙනට වැඩි වැඩියෙන් ආහාර ගැනීමේ හැකියාවත්, ආහාර හොඳින් දිරවන නිසා වැඩි පෝෂණයකුත් ලැබේ.

මේ සඳහා ඔබට නියුට්‍රිසැක් පවර් පැක් (Nutri Sacc Power Pack) භාවිතා කළ හැක. එහි අඩංගු සුවිශේෂ ක්ෂුද්‍ර ජීවින් නිසා (Live yeast) දිරවීමට අපහසු තන්තු ඉක්මනින් දිරවීමට හැකියාව ලැබේ. එසේම එහි අඩංගු නයිට්‍රජන් (NPN) ක්ෂුද්‍ර ජීවින් මගින් ප්‍රෝටීන් බවට පත් වන නිසා අමතර පෝෂණයක් දෙනට ලැබේ. තවද Nutri Sacc Power Pack හි අඩංගු බයිපාස් ප්‍රෝටීන, බයිපාස් මේදය දෙනට සෘජුවම ප්‍රයෝජනයට ගත හැකි වීමත්, උසස් තත්වයේ ඛණිජ හා විටමින් අඩංගු නිසා අමතර ඛණිජ විටමින් දීමේ අවශ්‍යතාවක් නොතිබීමත් නිසා Nutri Sacc Power Pack යනු ඉතා වටිනා ගව ආහාරයකි.

කිරි දෙවීම නතර කිරීම

ප්‍රධාන ක්‍රම 3 කි.

- Incomplete Milking (අසම්පූර්ණ කිරි දෙවීම)

මෙම ක්‍රමයේදී කිරි බුරුල්ලේ ඇති මුළු කිරි ප්‍රමාණයම දොවනවා වෙනුවට කොටසක් පමණක් දෙවීම සිදු කරයි. දින කිහිපයක් මෙලෙස වෙනදා කිරි දොවන වේලාවටම සිදු කරයි. අනතුරුව කිරි දෙවීම දිනක් හැර දිනක් සිදු කර බුරුල්ලේ කිරි හිඟ වන විට සම්පූර්ණයෙන්ම දෙවීම නතර කරනු ලැබේ.

- Intermittent Milking (විටින් විට කිරි දෙවීම)

මෙම ක්‍රමයේදී මුල සිටම කිරි දෙවීම සිදු කරනුයේ වතාවක් හැර වතාවක් වශයෙනි. දිනකට දෙවතාවක් දොවන දෙනකගේ නම්, මුල් දින කිහිපයේදී දිනකට වතාවක් පමණක් කිරි දොවා, පසුව දිනක් හැර දිනක් (දිනකට එක් වතාව බැගින්) කිරි දොවා, අවසානයේදී දෙවීම සම්පූර්ණයෙන්ම නවත්වනු ලැබේ.

- Complete Cessation (සම්පූර්ණයෙන්ම කිරි නතර කිරීම)

සාමාන්‍යයෙන් මෙම ක්‍රමය ක්‍රියාත්මක කරනුයේ නිෂ්පාදන මට්ටම දිනකට 10 L පමණ වන දෙනුන්ගේය. මෙහිදී එක වරම කිරි දෙවීම නතර කරනු ලැබේ.

ගැබ් ගත් දෙන පැටවා බිහි කිරීම

ගැබෙහි අවසාන සති කිහිපය

ගැබ් කාලයේ අවසාන සති කිහිපය ආසන්න වත්ම අපේක්ෂිත ගැබ් කාලය වන දින 285 ට ළඟා වන දෙන පැටවා බිහි කිරීම සඳහා සූදානම් වේ. එම නිසා අවසාන සති කිහිපය ඉතාමත් වැදගත් වේ. පසු පිටෙක දක්වෙන වගුව (ඇමුණුම I, 34 පිටුව) භාවිතා කිරීමෙන් ඔබට පැටවා බිහි වීමට අපේක්ෂිත දිනය දැන ගත හැකි අතර එය පෙර සූදානම සඳහා ඉතා වැදගත් වේ.

පැටවා බිහි වීමට සති 2 කට පෙර ඛණිජ ලබා දීම (විශේෂයෙන්ම කැල්සියම්) නැවැත්විය යුතු වේ. මේ දක්වා ගැබ් කාලය පුරාවට ඔබ ලබා දුන් කැල්සියම් ප්‍රමුඛ ඛණිජ අස්ථි පද්ධතියේ තැන්පත් වන අතර මතු ප්‍රයෝජනය සඳහා එසේ ගබඩා කරනු ලැබේ. කෙසේ වෙතත් එසේ ගබඩා වන්නේ ඔබ ඇති පදමට ඛණිජ ලබා දුනහොත් පමණි. එනම් දෙනගේ දෛනික ක්‍රියාකාරකම් සඳහා, ගැබෙහි සිටින පැටවාගේ වර්ධනයට හා මුල් මාස 7 ක කාලය ඔබ ලබා ගත් කිරි සමඟ ඉවත්වන ඛණිජ ප්‍රමාණයට සරිලන ඛණිජ ප්‍රමාණයක් ලබා දිය යුතු වේ.

පැටවා බිහි කිරීමේ ක්‍රියාවලියේදී සිදුවන මාංශපේෂි සංකෝචනය (තැටමීම) සඳහා අති විශාල කැල්සියම් ප්‍රමාණයක් වැය වේ. මෙම අති විශාල ඛණිජ ප්‍රමාණය කිසි විටකත් මුඛ මාර්ගයෙන් පවුඩර් වශයෙන් ලබා දිය නොහැක. එසේ කෙතරම් ඛණිජ පව්ඩර් ලබා දුන්නත් එම ඛණිජ ක්‍ෂණිකව රුධිර ගත වී සත්වයාට ප්‍රයෝජනයට ගත හැකි වන්නේ නැත. එසේම අස්ථි වල ගබඩා කරන ලද කැල්සියම් ක්ෂණිකව රුධිරගත වන්නේද නැත. ඊට අදාළ හෝමෝන නිසි පරිදි ක්‍රියාත්මක වී අවශ්‍ය පරිදි කැල්සියම් රුධිර ගත වීම සඳහා සති 2 ක පමණ කාලයක් ගත වේ. මෙම කාලය තුළදී, ශරීරය, පැටවා ප්‍රසූත කිරීමේදී අවශ්‍ය අධික කැල්සියම් ප්‍රමාණය ලබා ගැනීමට හුරු වීම සිදු වේ.

එබැවින් අවසාන සති 2 තුළදීත් අප ඛණිජ ලබා දුනහොත් හැඩ ගැසීම නොවන නිසා අධික කැල්සියම් අවශ්‍යතාව සපුරා ගැනීමට නොහැකි වීමෙන් 'කිරි උණ තත්වය' ඇතිවේ. එහිදී දෙනට සිට ගෙන සිටීමට නොහැකි වීමෙන් ගැටළු රැසක් ඇතිවේ. පැටවාට කිරි නොලැබී යාම, කිරි දොවා ගැනීමට නොහැකි වීම හා ප්‍රතිකාර සඳහා අධික මුදලක් වැය කිරීමට සිදු වීම සෘජු ආර්ථික අවාසි වන අතර අවාසනාවන්ත ලෙස දෙන මිය ගියහොත් ආර්ථික හානිය තීව්‍ර වේ. (රෝගී තත්වය පිළිබඳ වැඩි විස්තර පසු පරිච්ඡේදයක දී වැඩිදුර සාකච්ඡා කෙරේ.)

අවසාන මොහොත දක්වාම ඛණිජ ලබා දීම, ප්‍රමාණවත් පරිදි ඛණිජ ලබා නොදීම යන ප්‍රධාන හේතු 2 ම කිරි උණ වැළඳීමට හේතු වේ. පැටවා බිහි කිරීමේදී තම දෙනට මෙම තත්වය ඇති වේද යන්න කලින් හඳුනා ගැනීම

අසීරු බැවින් පැටවා බිහි කිරීමට පැය 6-12 කට පෙර හා පැටවා බිහි කර පැය 6 කට පසු වශයෙන් කැලප් ජෙල් (Calup Gel) 2 ක් ලබා දීමෙන් මෙම තත්වය මඟ හරවා ගත හැක. එමඟින් සිදු විය හැකි විශාල ආර්ථික හානියක් වළකා ගත හැක.

අවසාන කිරි දෙවීමෙන් පසු බුරුල්ලේ පුඩු හතරට (Dry cow therapy) නැමැති බුරුළු බෙහෙත් 4 ක් යෙදීමෙන් ඊළඟ මුරය ආරම්භයත් සමඟ බුරුළු ප්‍රදාහය සෑදීමට ඇති ඉඩ කඩ විශාල වශයෙන් අවම කර ගත හැක. තවද බුරුළු ප්‍රදාහය ඇතිවීමේ ප්‍රවණතාවය අවම කර ගැනීම සඳහා විශේෂයෙන්ම අවධානම වැඩි මුල් සති කිහිපයේදී ප්‍රොවිකැල් (Provical) ලබා දිය හැක.

ඔබ කළ යුතු දේ

- බණිජ වර්ග ලබා දීම නවත්වන්න (සති 2 කට පෙර).
- Calup Gel 2 ක් ගෙනවිත් තබා ගන්න (ප්‍රථමාධාර වශයෙන්).
- සතියකට පෙර ගැබ් ගත් දෙන අනෙකුත් දෙනුන්ගෙන් වෙන් කරන්න. ගාලක් නොමැති නම් අව්වෙන් වැස්සෙන් පින්නෙන් ආරක්‍ෂා විය හැකි ආවරණයක් යටට ගේන්න. නිසංසල වටපිටාවක් තෝරා ගන්න.
- පිරිසිදු, සමතලා බිමක පැටවා බිහි කිරීම වඩාත් යෝග්‍ය වේ.
- ගොම නිතර ඉවත් කර පිරිසිදු කරන්න.
- පිදුරු වැනි වියළි, බිම ඇතිරිය හැකි ද්‍රව්‍යයක් සූදානම් කර ගන්න.
- සීමා රහිතව ජලය හා ආහාර ලබා දෙන්න.
- වෙනදාට වඩා වැඩි අවධානයක් දෙන කෙරෙහි යොමු කරන්න.
- ළඟ දිනකදී පැටවකු බිහි කළ ස්ථානයක් නම් හෝ ඒ වෙනුවෙන්ම සකස් කළ ස්ථානයක් නම් සෑම පැටවකු බිහි වීමටම පෙර හා පසු ස්ථානය හොඳින් පිරිසිදු කර විරොසිඩ් (Virocid) දමා විෂබීජ හරණය කරන්න.

නොකළ යුතු දේ

- දිගින් දිගටම බණිජ ලබා දීම.
- උලා කෑම සඳහා යැවීම/අනාරක්ෂිත බැවුම්/දිය කඩිති වැනි ස්ථාන වල දිගේලි කිරීම.
- අපවිත්‍ර ස්ථාන වල ගැට ගැසීම.
- තද අව්ව, වැස්සට නිරාවරණය වීම.
- මඩ සහිත, අපිරිසිදු, සමතලා නොවන බිමක් පැටවාගේ උපත වෙනුවෙන් තෝරා ගැනීම.
- ජලය හා ආහාර සීමා කිරීම. ජල බඳුන හා කෑම බඳුන හිස් වීම.

වසු පැටවාගේ උපත

පසු පිටෙක දැක්වෙන වගුව (ඇමුණුම I, 34 පිටුව) භාවිතා කිරීමෙන් ඔබට පැටවා ඉපදීමට අපේක්ෂිත දිනය බලා ගත හැක.

පැටවා බිහි කිරීමට ආසන්න වත්ම මව් දෙනගේ,

- කිරි බුරුල්ල විශාල වී, කිරි වලින් පිරී පාත් වෙයි.
- උකුල් ප්‍රදේශයේ බන්ධනී ලිහිල් වේ.
- උපත් මාර්ගයේ බාහිර අවයව ඉදිමීම, රත්පැහැ වීම හා විස්තාරණය (ලිහිල් වීම) වේ.
- උපත් මාර්ගයෙන් ස්‍රාවයන් ගැලීම ඇරඹේ.
- ආහාර ගැනීම අඩුකරයි / නවතා දමයි.
- වලිගය ඉහලට ඔසවාගෙන සිටීම හා නිතර නිතර මුත්‍රා කරයි.
- අවිවේකී ස්වරූපයක් පෙන්නුම් කරයි.
- නිතර නිතර වාඩිවීමත් හිටගැනීමත් සිදුකරයි.

පැටවාගේ බිහිවීම අදියර 3 කින් දැක්විය හැක.

- **පළමු අදියර**

ගැබ්ගෙල ලිහිල් වීම, ගර්භාශය සංකෝචනය වීම ඇරඹීම, පැටවා බිහිවන ඉරියව්වට හැරීම හා මවගේ හැසිරීමේ වෙනස්කම් සිදුවන්නේ මේ අදියරේදීය. පැය 02 ත් 06 ත් අතර කාලයක් මේ සඳහා ගතවේ.

● **දෙවන අදියර**

මව්දෙන තැටමීම, වතුර මල්ල පුපුරා උපත් මාර්ගයෙන් ඉවතට ගැලීම, දෙවන මල්ල පුපුරා ඝන සෙවල වැනි ද්‍රව්‍යක් ගැලීම හා පැටවාගේ බිහිවීම මෙම අදියරේදී සිදුවේ. සාමාන්‍යයෙන් මෙය සිදුවන්නේ පැයක වැනි කාලාන්තරයකදීය.

● **තෙවන අදියර**

වැදෑමහ ඉවත් වීම, තැටමීම නතර කිරීම හා ගර්භාෂයේ සංකෝචනය නතර වීම මෙම කාලයේදී සිදුවේ. පැය 04 දක්වා කාලයක් මේ සඳහා ගතවිය හැක.

අළුත උපන් පැටවා රැක බලා ගත යුතු ආකාරය මුලදි සාකච්ඡා කල බැවින් මෙතැන් පටන් සාකච්ඡා කරනුයේ මව්දෙන රැකබලා ගන්නා ආකාරයයි.

පැටවා බිහි කිරිමෙන් පසු මුල්දින 3-4 තුල නිපදවන මුල් කිරි පැටවාට බීමට හැර ඉන් අනතුරුව අපගේ ප්‍රයෝජනය සඳහා කිරි දෙවීම කළ හැකිය. එහිදී පැටවාට ප්‍රමාණවත් තරම් ඉතිරි කොට දොවා ගැනීම ඉතාමත් වැදගත් වේ.

කිරි ගව පාලනය ආර්ථික කටයුත්තක් බැවින් හැමවිටම ඵලදායීතාව ප්‍රශස්ථ (හොඳම) මට්ටමක පවත්වා ගත යුතුය. ඒ අනුව සෑම වසරකම එක් පැටවකු ලබා ගැනීම ඉලක්ක කර ගත යුතු වේ. එම ඉලක්කය ඉටුකර ගැනීමට නම් අවම වශයෙන් පැටවා බිහිකර දින 90 ගත වෙද්දී දෙන නැවත ගැබ් ගෙන සිටිය යුතුය. දළ වශයෙන් සිංචනයක් සාර්ථක වීම සඳහා 2 වතාවක් වත් කෘතිම සිංචනය (AI) කළ යුතුයයි සැලකීමට සිදුවේ. එසේම ප්‍රසූතියෙන් පසු ප්‍රථම පට්ටි ලකුණු අවස්ථාව මඟ හැරීම අනිවාර්ය වේ (ප්‍රථම මාස 2 තුල). ඒ අනුව ප්‍රසූතියෙන් අඩුම වශයෙන් දින 45 ක් වත් යන විට දෙන පට්ටියට පැමිණිය යුතුය. දින 45 පසු කර ගත වන සෑම දිනයක්ම අර්ථික වශයෙන් අවාසියක් ගෙන දෙනු ඇත.

එබැවින් දින 45 ක් බලා සිට ගැටළුවට පිළිතුරු සොයනවාට වඩා ගැටළු ඇති වීම අවම කරගෙන නිසි කලට පට්ටිය ගෙන්වා ගැනීම හැම අතින්ම වාසිදායක වේ.

එම අරමුණ ඉටු කර ගැනීම සඳහා විශේෂයෙන්ම නිපදවා ඇති බෙස්ට්මින් ගෝල්ඩ් (Bestmin Gold) විශේෂ ඛණිජ විටමින් ආහාරය ප්‍රත්‍යක්ෂ ප්‍රතිඵල ලබා දීමට සමත්ය. ඔබ කල යුත්තේ Bestmin Gold දිනකට මේස හැඳි 2 බැගින් (30g) දින 40 ක් (කි 1 ග්‍රෑ 200 පැකට් 1ක්) පැටවා බිහි කල දින සිටම මව් දෙනට ලබා දීමයි. මෙම කාලය තුලදී වෙනත් ඛණිජ ලබා දීමට අවශ්‍ය නොවන අතර වසරකට එක් පැටවකු සඳහා වැය වන්නේ වසරකටම Bestmin Gold එක් පැකට්ටුවක් පමණි.

මෙලෙස Bestmin Gold ලබා දීමෙන් මව් දෙනව කලට වේලාවට පට්ටියට ගෙන්වා ගත හැකි වනවා සේම කරන සිංචන සාර්ථක වීම කෙරෙහි ද එය සෘජුවම බලපායි. එසේම කිරි එලදාව හා එහි ගුණාත්මක භාවය ඉහළ දැමීමට මෙය සමත් වේ.

පැටවා බිහි කර තවමත් පට්ටි ලකුණු නොපෙන්වූ දෙනුන්ටත්, සිංචනය සාර්ථක නොවෙන දෙනුන්ටත්, තවමත් ප්‍රථම පට්ටියට නොපැමිණි නැම්බි වැස්සියන්ටත් යන සියළු ප්‍රජනන ගැටළු සහිත සතුන් සඳහා මෙම දින 40 හේ Bestmin Gold ප්‍රතිකාරයෙන් සාර්ථක එල නෙලා ගත හැක.
එසේම ගැබ් කාලයේ අවසාන මාස 02 තුල නිසි පෝෂණය නොලද දෙනුන් පැටවා බිහි කර කිරි නිපදවීම ඇරඹීමත් සමග මුල සති කීපයේදී වැහැරීම නිසා (දේහ ලකුණු ප්‍රමාණය පහල යෑම) නැවත පට්ටියට පැමිණීම ප්‍රමාද වියහැක. එබැවින් පැටවා බිහි කරන මොහොතේ මව් දෙන හොඳ දේහ ලකුණු ප්‍රමාණයක් ලබා සිටීම (BCS 3.5 / 4) ඉතා වැදගත් වේ. එම ලකුණු ප්‍රමාණය පහළ යත්ම එනම් වැහැරීමත් සමඟ පට්ටියට පැමිණීම ප්‍රමාද වනු ඇත.

පැටවා බිහි කිරීමෙන් පසු පට්ටියට ඒමට ප්‍රමාද වීමට බලපාන වෙනත් හේතු.

- පැටවුන් ගණනාවක් බිහි කර තිබීම.
- වයසක දෙනක් වීම
- අහිතකර පරිසර සාධක උදා. අධික රස්නය
- අපවිත්‍ර ස්ථානයක පැටවා බිහිකිරීම.
- පැටවා බිහිකිරීමේදී ඇතිවූ සංකූලතා.
- පැටවා හිරවීම.
- වැදෑමහ වැටීම ප්‍රමාද වීම.
- උපතේදි ගර්භාෂය/උපත් මාර්ගය එළියට ඒම.
- උපත් මාර්ගයට /ගර්භාෂයට විෂබීජ ඇතුළු වී විස වීම/නරක් වීම.
- පැටවා දිගටම කිරි උරා බීම හා මව හා පැටවා අධික ලෙස ලෙන්ගතු වීම.

මෙම ගැටළු මගහරවා ගැනීමේ ක්‍රම

- නිවැරදි පෝෂණය හා බෙස්ට්මින් ගෝල්ඩ් (Bestmin Gold) දින 40 ක් ලබා දීම
- මහළු සතුන් වෙනුවට අළුත් සතුන් ප්‍රතිස්ථාපනය.
- පැටවා බිහි කිරීමට සුදුසු පිරිසිදු පරිසරයක් සැකසීම.
- පැටවා බිහි කිරීමට ඇති විය හැකි අපහසුතා අවම කිරීමට අවශ්‍ය අවස්ථාවේදී පශු වෛද්‍ය සහාය ලබා ගනීම.
- ආසාදනයක්/ප්‍රදාහයක් ඇති වුවහොත් වහාම ප්‍රතිකාර කිරීම
- කිරි දොවන අවස්ථාවේදී (දිනකට 2 වතාවක්) පමණක් පැටවාට කිරි උරා බීමට ඉඩදීම.

පැටවා නැති විට කිරි හංගන්නේ නම්, දෙවීමට පෙර පැටවාට කිරි ටිකක් බීමට ඉඩදී ඔබ කිරි දොවාගත් පසු නැවත විනාඩි 10-15 ක් පමණ කිරි බීමට (ප්‍රමාණවත් පරිදි) ඉඩ හරින්න.

නව කිරි මුරයක ආරම්භය

කිරි මුරය

පැටවකු බිහිකල දෙනකගේ මුල් දින 3-4 තුල ලබා ගන්නා මුල් කිරි (Colostrum) පැටවාට ඉතාමත් වැදගත් අහාරයක් බැවින් පැටවාගේ දේහ බරට සරිලන පරිදි නියමිත ප්‍රමාණය දිනකට කිහිප වතාවක් ලබා දීම ඉතා වැදගත් වේ. එසේම මුල් මාස දෙක තුළ පැටවාගේ වර්ධනයට අවශ්‍ය සියළුම පෝෂණය සැපයීමේ හැකියාවක් කිරි වලට ඇති බැවින් පැටවාට ප්‍රමාණවත් තරම් කිරි ලබා දීම ඉතාමත් වැදගත් වේ (මේ පිළිබඳ විස්තර මුලදී සඳහන් කරන ලදී).

සාමාන්‍යයෙන් කිරි මුරයක් ලෙස හඳුන්වනු ලබන කාලය දින 305 ක කාලයයි. වසරකට පැටවකු යන සංකල්පය යටතේ සෑම දින 365 කට වරක් පැටවකු අපේක්ෂා කරන අතර ගැබ් ගත් දෙනකගෙන් කිරි නොගන්නා අවසාන මාස 02 (දින 60 ක කාලය) අතහැරී විට කිරි මුරය දින 305 ක් ලෙස සැලකේ .

දෙනගේ කිරි නිෂ්පාදනය මුල් දිනයේ සිට ක්‍රමානුකූලව වැඩි වී උපරිමයට ලඟාවන අතර කල්යත්ම ක්‍රමානුකූලව අඩුවේ. එමනිසා වසරක් ඇතුලත නැවත පැටවකු ලබාගත නොහැකි වුවහොත් ප්‍රමාද වන කාලයේදි කිරි ලබා ගතහැකි වන්නේ කිරි මුරයේ අඩු කිරි ඵලදාවක් ඇති අවසාන කාලයෙනි. එබැවින් එය ආරථික වශයෙන් අලාභයකි.

එකම කිරි මුරයකදී ක්‍රමානුකූලව කිරි ප්‍රමාණය වැඩි වී අඩුවන්නා සේම කිරි මුරයෙන් මුරයටද ක්‍රමානුකූලව කිරි අස්වැන්න වැඩි වී කිරි මුර 4-5 ඉක්ම ගිය පසු කිරි අස්වැන්න අඩුවේ.

කිරි ගන්නා දෙනගේ පෝෂණය

කිරි නිෂ්පාදනය කරන දෙනගේ පෝෂණ අවශ්‍යතාව කිරි නිෂ්පාදනය නොකරන දෙනකට වඩා ඉතා ඉහළ අගයක් ගනී.

ප්‍රධාන වශයෙන්,

- ජලය
- තෘණ
- රනිල
- සාන්ද්‍ර ආහාර
- ඛණිජ/විටමින්

නිසි පරිදි කළමනාකරණය තුලින් දෙනකට අවශ්‍ය ප්‍රශස්ථ පෝෂණය සැපයිය යුතුය. එසේ සපයන විට නිතැතින්ම දෙන ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව වැඩි කිරි ඵලදාවක් ලබා දෙනු ඇත.

නිපදවන සෑම කිරි ලීටර් 1 ක් සඳහාම ජලය ලීටර් 3-4ක් වැයවේ. එබැවින් කිරි ලීටර් 10 ක් නිපදවන දෙනකට කිරි නොනිපදවන සත්වයෙකුට වඩා අමතර වතුර ලීටර් 30-40 ක් වත් අවශ්‍ය වේ. මෙම අවශ්‍යතාව සම්පූර්ණ නොවන විට දෙන නිපදවන කිරි ප්‍රමාණය අඩුවේ.

එබැවින්,

- පිරිසිදු ජලය
- හැම විටම (සතාට අවශ්‍යවන ඕනෑම අවස්ථාවක බීමට)
- බීමට හැකි අයුරින් තැබීම

අනිවාර්ය අවශ්‍යතා වේ.

එසේම තෘණ වර්ග, රනිල වර්ග, සාන්ද්‍ර ආහාර නිසි අනුපාතයට ලබා දීමෙන් උපරිම පෝෂණයක් අවම වියදමකින් ලබා දී ඉහළ කිරි අස්වැන්නක් ලඟා කරගත හැක. ගැබ්ගත් දෙනගේ පෝෂණය යටතේ සාකච්ඡා කළ මූලික කරුණු මෙහිදීද එක ලෙස වලංගු වේ.

එසේම, ඕනෑම මොහොතක කෑම සඳහා දෙනට අහාරයක් තිබීම ඉතා වැදගත් වේ.

තවද කිරි හරහා විශාල වශයෙන් කැල්සියම් ඇතුළු ඛනිජ වර්ග රැසක් ශරීරයෙන් ඉවත් වේ. එසේ ඉවත්වන ප්‍රමාණය නැවත ලබා දීම සීමා වුවහොත් ඛණිජ මදි වීම නිසා කිරි නිෂ්පාදනය අඩුවේ. ගුණාත්මක භාවයෙන් ඉහළ මිනමැක්ස් (MINAMAX) වැනි ඛණිජයක් නිර්දේශිත ප්‍රමාණයෙන්ම ලබා දීම තුලින් කිරි නිෂ්පාදනය කෙරෙහි ඇතිවන මෙම

අහිතකර බලපෑම වළක්වාගත හැක.

එසේම පෙර විස්තර කරන ලද නියුට්‍රිසැක් පවර් පැක් යන සමබල ආහාරය ලබා දීම තුලින් කිරි ගන්නා දෙනට අවශ්‍ය පෝෂණය ඉහළ දැමීමෙන් ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව ඉහළ නිෂ්පාදනයක් ලබාගත හැක. ඔබ නියුට්‍රිසැක් පවර් පැක් ලබා දෙන්නේ නම් අමතර ඛනිජ ලබා දීමට අවශ්‍ය නැත.

ගවයන්ට නිතර සෑදෙන රෝග හා ඒවා වළක්වා ගැනීම

රෝගයක් සෑදීම ආර්ථික වශයෙන් විශාල පාඩුවකි.

- කිරි නිෂ්පාදනය අවම වීම.
- ඖෂධ සඳහා මුදල් වැය වීම.
- ඇතැම් විට සත්වයා මිය යෑම.
- මව රෝගී වූ විට පැටවා දුර්වල වීම.
- හිමිකරුගේ කාලය/ශ්‍රමය වැය වීම හා මානසික ආතතිය.

එම නිසා රෝග වළක්වා ගැනීම ප්‍රතිකාර කිරීමට වඩා හැම අතින්ම වාසිදායක වේ.

කිනිතුළු උණ

කිනිතුල්ලන් ලේ උරා බීම නිසා වන හානියට වඩා දරුණුම හා ඇතැම් විට මාරාන්තික විය හැකි තත්වය වන්නේ ''බැබීසියා'' නම් රෝගයයි. සාමාන්‍ය ව්‍යවහාරයේ මෙම රෝගය කිනිතුළු උණ ලෙස හඳුන්වයි. කිනිතුල්ලන් මගින් පැතිරෙන, කිනිතුල්ලන්ගේ ශරීරයේ සිටින බැබීසියා නම් අන්වීක්ෂීය ජීවියා මගින් මෙම රෝගය ඇතිවේ. බැබීසියා රුධිර ගත වූ විට රතු රුධිරාණු විනාශ වන අතර මෙම තත්වයට ඉක්මන් ප්‍රතිකාර නොකළහොත් මරණය පවා සිදුවිය හැක. පෙර සඳහන් කළ පරිදි වඩාත් වැදගත් වන්නේ රෝගය වළක්වා ගැනීමයි. කිනිතුල්ලන් පාලනය ඒ සඳහා හොඳම මගයි. මේ සඳහා බේටිකෝල් ඊ.සී.(Bayticol EC), බේටිකෝල් පෝ - ඔන් (Bayticol Pour On), ඇන්ටික් (Antick) හෝ ටිකමිට් (Tickamit) භාවිතා කළ හැක.

මෙම ඖෂධ භාවිතා කිරීමේදී,

- නියමිත මාත්‍රාව භාවිතා කිරීම.
- සත්වයා වියළිව සිටියදී භාවිතා කිරීම.
- කිනිතුල්ලන් බෝ වන්නේ පරිසරයේ බැවින් ගව ගාල තුළටත් ඉසීම.

වැනි ක්‍රම අනුගමනය කිරීම මගින් නැවත භාවිතා කලයුතු කාලාන්තරය වැඩි කරගෙන උසස් ප්‍රතිඵල ලබා ගත හැක.
නිවැරදි භාවිතය සඳහා (ඇමුණුම V, 41 පිටුව) බලන්න.

කිරි උණ

කැල්සියම් ඌනතාවය හා කැල්සියම් ආශ්‍රිත ගැටළුවක් ලෙස මෙම තත්වය ඇතිවේ. මව් දෙන පැටවා බිහි කිරීමට පැය කිහිපයකට පෙර සිට පැටවා බිහිකර මුල් දින කිහිපය මෙම තත්වයට පත්වීමේ ඉහල අවදානමක් පවතී. කිරි උණ නමින් හැඳින් වුවද මෙහිදී සිදුවන්නේ ශරීර උෂ්ණත්වය පහල යාමයි. කොරගැසීමේ සිට බිම ඇද වැටුන දෙන නැවත නැගී නොසිටින තත්වය දක්වා රෝග ලක්ෂණ ඇතිවිය හැක.

වළක්වා ගැනීම සඳහා,

- ගැබ් කාලය/කිරි ගන්නා අවධිය තුළ නිර්දේශිත ගුණාත්මක ප්‍රමිතියෙන් යුතු ඛණිජ වර්ග නිසි මාත්‍රාවෙන් ලබා දීම.
- පැටවා බිහි වීමට නියමිත දිනට සති 2 කට පෙර සියළුම ඛණිජ නැවැත්වීම.
- පැටවා බිහි වීමට ඉතා ආසන්න වත්ම (පැය 6-12 ක්) අතර Calup Gel 1 ක් පෙවීම.
- පැටවා බිහි කර පැය 6-12 ක් අතර තවත් Calup Gel 1 ක් පෙවීම.

මෙම සියල්ල ඉටු කර තිබියදීත් ඔබගේ දෙන වැටුණහොත් ළඟම පශු වෛද්‍යවරයාගේ උපදෙස් මත කටයුතු කරන්න.

පැටවුන්ට සෑදෙන බඩේ ගාය / බඩ යෑම (Calf Scours)

අලුත උපන් පැටවා බාහිර පරිසරයේ රෝගකාරක වලට ඉතාමත් සංවේදීය. එබැවින් නිවැරදි පෝෂණයක් නොලබන, මුල් කිරි නොලබන, නිවැරදි ලෙස ඇති දැඩි නොකරන, අපවිත්‍ර පරිසරයක වැඩෙන වසු පැටවා රෝගී වීමේ ඉහළ ප්‍රවණතාවයක් ඇත.

කුඩා කල ඇති වන බඩ යෑම වෛරස්, බැක්ටීරියා හෝ වෙනත් පරපෝෂී හේතුවක් නිසා විය හැක. ආහාර අරුචිය, දුර්වල වීම, බඩ යෑම නිසා විජලනයට පත්ව අවසානයේ මිය යෑම දක්වා මෙම තත්වය දරුණු විය හැක. පශු වෛද්‍ය උපදෙස් මත නිවැරදි ඖෂධ ලබා දීම හා විජලනයට පත්වන පැටවා ඉන් මුදා ගැනීම සඳහා සේලයින් ලබා දීම මඟින් මරණ අනුපාතය අවම කර ගත හැක.

රෝගය ඇතිවීම වළක්වා ගැනීම සඳහා ඔබට ගත හැකි පියවර:

- උපන් විගසම පැටවාට අවශ්‍ය පරිදි මුල් කිරි ලබා දීම.
- වර්ධනයට සාපේක්ෂව ඊට ගැලපෙන පරිදි නිසි පෝෂණය සැලසීම
- පැටවා හොඳින් රැක බලා ගැනීම
- වටපිටාව පිරිසිදුව තබා ගැනීම
- රෝගී වූ පැටවුන් අන් පැටවුන්ගෙන් වෙන් කිරීම
- රෝගී වූ සතුන්ගේ ගොම, මළ ද්‍රව්‍ය අන් සතුන් හා නොගැටෙන පරිදි ඉවත් කිරීම
- මී ගව පැටවකු නම් දින 14 දී ද, එළ ගව පැටවකු නම් දින 30 දී ද පණු බෙහෙත් ලබා දීම (පණු බෙහෙත් ලබා දීමේ සටහන පසු පිටෙක දැක්වේ - ඇමුණුම IV, 39 පිටුව)

පෙකනිය පැසවීම හා හන්දි ඉදිමීම

මෙම තත්වය ඇති වීමට 100% ක්ම බලපාන්නේ ගොවි මහතුන් අතින් සිදුවන අඩුපාඩු කම්ය. එබැවින් පැටවාගේ පෙකනි වැල තදින් ගැට ගසා කපා දැමීම ගැන ඉහතදී සාකච්ඡා කළ කරුණු ඉතාමත් වැදගත් වේ. පෙකනිවැල ඉක්මනින් වියළීම හා පිරිසිදු වියළි පරිසරයක පැටවා ඇති දැඩි කිරීම ඉතා වැදගත්ය. ප්‍රමාණවත් තරම් මුල් කිරි උපන් විගසම ලැබීම පැටවාට මෙම රෝග තත්වය සමඟ සටන් කිරීමට ලැබෙන වටිනාම ශක්තියයි.

පෙකනිවැල හරහා ඇතුළු වන විෂබීජ ශරීරය තුළ පැතිරී යන ආකාරය අනුව රෝගයේ සංකීර්ණතාව වෙනස් විය හැක. ඇතැම් විටෙක එය පෙකනිය පැසවීමෙන් නතර වන අතර තවත් විටෙක මුළු ශරීරයම ආසාදනය වී මරණයට පත් වේ. ඇතැම් විටෙක රෝග කාරක විෂබීජ පැටවාගේ සන්ධි වලට ඇතුළු වී සන්ධි ඉදීමීමේ රෝගය ඇති කරයි. පශු වෛද්‍ය උපදෙස් මත හැකි ඉක්මනින් ප්‍රතිකාර කළ යුතු තත්වයක් වන මෙය වළක්වා ගැනීමේ හොඳම ක්‍රමය නම්, මුල්කිරි ප්‍රමාණවත් පරිදි ලබා දීම හා පිරිසිදු වියළි පරිසරයක පැටවා පෝෂණය කිරීමයි.

බුරුළු ප්‍රදාහය

කිරි ගන්නා දෙනකුගේ වටිනාම අවයවය කිරි බුරුල්ලයි. පුඩු හතරක් සහිත කිරි බුරුල්ල හොඳින් රැක බලාගැනීම තුළින් බාධාවකින් තොරව කිරි මුරය පුරාම කිරි ලබා ගත හැක. එහෙත් බොහොමයක් ගොවියන්ට ඇති ප්‍රධාන ගැටළුවක් නම් කිරි බුරුල්ල පැසවීම/නරක් වීම/බුරුළු ප්‍රදාහය ඇති වීමයි. වාසනාවකට මෙන් කිරි බුරුල්ල වෙන වෙනම පවතින කුටීර හතරකින් යුක්ත වන අතර එම කුටීර එකිනෙකට සම්බන්ධ නැත. එබැවින් එක් කිරි පුඩුවක් රෝගී වුවත් ඉතිරි පුඩු වලින් සාමාන්‍ය පරිදි කිරි දොවා ගැනීමට හැකි වනවා සේම එම පුඩු රෝගී වීමෙන් වළක්වා ගැනීමට ද හැක.

කිරි පුඩුවක් රෝගී වී ඇති බව ඉතාමත් වේලාසනින් දැනගත හොත් ප්‍රතිකාර කිරීමෙන් ඉක්මනින්ම පෙර පැවති තත්වයටම පත් කර ගත හැක

එසේම රෝගය හඳුනා ගැනීමට ප්‍රමාද වීම නිසා තත්වය බරපතල වී එම කිරි පුඩුවෙන් නැවත කිරි ලබා ගැනීමට නොහැකි තත්වයක් දක්වා වර්ධනය විය හැක. එබැවින් සෑම දිනකම කිරි දෙවීමට ප්‍රථම කළු පැහැති පෙරහන් රෙද්දක් දැමූ කෝප්පයකට සෑම දෙනකගේම, සෑම කිරි පුඩුවකින්ම කිරි ස්වල්පයක් දොවා පරීක්ෂා කළ යුතුය. කිරි වල කැටි ගැසීමක්, අව පැහැවීමක්, කැදලි ස්වරූපයක් හෝ වෙනත් ඕනෑම ආකාරයක වෙනසක් ඇත්නම් එම පුඩුවට ප්‍රතිකාර කිරීම ඇරඹිය යුතුය. බුරුල්ල ඉදිමී රත් පැහැ වී කිරි දෙනට වේදනාකාරී වීම නිසා කිරි දෙවීමට නොදෙන අවස්ථාව වන විට ගොවියා ප්‍රමාද වැඩිය.

රෝගී වී ප්‍රතිකාර කිරීමට වඩා රෝගය වළක්වා ගැනීම හැම අතින්ම වැදගත්ය. එනිසා පහත දැක්වෙන කරුණු අනුගමනය කරන්න.

- කිරි දෙවීමට පෙර සියළු භාජන, කිරි දොවන්නාගේ දෑත් හා කිරි බුරුල්ල හොඳින් පිරිසිදු කරන්න.
- කිරි දෙවීමට පෙර ඉහත සඳහන් කල පරිදි කළු පෙරහන් කඩකට කිරි දොවා පරීක්ෂා කරන්න.
- රෝගී සතුන්ගේ කිරි අවසානයට දොවන්න. රෝගී පුඩුවේ කිරි අවසානයට දොවන්න.
- රෝගී පුඩුවක කිරි දෙව්වේ නම් ඔබගේ දෑත් නැවත පිරිසිදු කර ගන්න
- කිරි දොවා ගැනීමෙන් පසු කිරි පුඩු විෂබීජ නාශක දියරයක ගිල්වන්න. මෙම දියර පශු වෛද්‍ය කාර්යාල මගින් ලබා ගත හැක. නැතිනම් විනාකිරි කොටස් එකකට පිරිසිදු ජලය කොටස් එකක් දමා ද්‍රාවණයක් සාදාගන්න.
- කිරි දොවා පැය බාගයක් පමණ යනතුරු පුඩුවේ විවරය නොවැසෙන බැවින් ගවයාට හිටගෙනම කෑම සඳහා තණ කොළ දමන්න.
- කිරි දොවන ස්ථානය පිරිසිදුව හා වියළිව පවත්වා ගෙන යන්න.
- බුරුළු ප්‍රදාහය ඇතිවීමේ ප්‍රවණතාවය අවම කිරීම සඳහා ප්‍රොවිකැල් (Provical) ද්‍රාවණය ලබා දිය හැක. මෙමගින් බුරුළු ප්‍රදාහය සෑදීමේ ප්‍රවණතාවය අවම වන අතර මෙය රෝගී වූ සතුන්ට ලබා දෙන ප්‍රතිකාරයක් නොවන බව නම් සිහියේ තබා ගත යුතුය.

ඇමුණුම I

ගව දෙනුන්ගේ කෘතිම සිංචන හා උපත් දින දර්ශනය

කෘතිම සිංචනය කල දිනය, වසු පැටවකුගේ උපත සිදුවන දිනය **(අපේක්ෂිත ගැබ් කාලය - දින 285)**

ජනවාරි	01	02	03	04	05	06	07	08	09	10	11	12	13	14	15	16	17	18	19	20	21	22	23	24	25	26	27	28	29	30	31	
ඔක්තෝබර්	08	09	10	11	12	13	14	15	16	17	18	19	20	21	22	23	24	25	26	27	28	29	30	31	01	02	03	04	05	06	07	නොවැම්බර්
පෙබරවාරි	01	02	03	04	05	06	07	08	09	10	11	12	13	14	15	16	17	18	19	20	21	22	23	24	25	26	27	28				
නොවැම්බර්	08	09	10	11	12	13	14	15	16	17	18	19	20	21	22	23	24	25	26	27	28	29	30	01	02	03	04	05				දෙසැම්බර්
මාර්තු	01	02	03	04	05	06	07	08	09	10	11	12	13	14	15	16	17	18	19	20	21	22	23	24	25	26	27	28	29	30	31	
දෙසැම්බර්	06	07	08	09	10	11	12	13	14	15	16	17	18	19	20	21	22	23	24	25	26	27	28	29	30	31	01	02	03	04	05	ජනවාරි
අප්‍රේල්	01	02	03	04	05	06	07	08	09	10	11	12	13	14	15	16	17	18	19	20	21	22	23	24	25	26	27	28	29	30		
ජනවාරි	06	07	08	09	10	11	12	13	14	15	16	17	18	19	20	21	22	23	24	25	26	27	28	29	30	31	01	02	03	04		පෙබරවාරි
මැයි	01	02	03	04	05	06	07	08	09	10	11	12	13	14	15	16	17	18	19	20	21	22	23	24	25	26	27	28	29	30	31	
පෙබරවාරි	05	06	07	08	09	10	11	12	13	14	15	16	17	18	19	20	21	22	23	24	25	26	27	28	01	02	03	04	05	06	07	මාර්තු
ජුනි	01	02	03	04	05	06	07	08	09	10	11	12	13	14	15	16	17	18	19	20	21	22	23	24	25	26	27	28	29	30		
මාර්තු	08	09	10	11	12	13	14	15	16	17	18	19	20	21	22	23	24	25	26	27	28	29	30	31	01	02	03	04	05	06		අප්‍රේල්
ජුලි	01	02	03	04	05	06	07	08	09	10	11	12	13	14	15	16	17	18	19	20	21	22	23	24	25	26	27	28	29	30	31	
අප්‍රේල්	07	08	09	10	11	12	13	14	15	16	17	18	19	20	21	22	23	24	25	26	27	28	29	30	01	02	03	04	05	06	07	මැයි
අගෝස්තු	01	02	03	04	05	06	07	08	09	10	11	12	13	14	15	16	17	18	19	20	21	22	23	24	25	26	27	28	29	30	31	
මැයි	08	09	10	11	12	13	14	15	16	17	18	19	20	21	22	23	24	25	26	27	28	29	30	31	01	02	03	04	05	06	07	ජුනි
සැප්තැම්බර්	01	02	03	04	05	06	07	08	09	10	11	12	13	14	15	16	17	18	19	20	21	22	23	24	25	26	27	28	29	30		
ජුනි	08	09	10	11	12	13	14	15	16	17	18	19	20	21	22	23	24	25	26	27	28	29	30	01	02	03	04	05	06	07		ජුලි
ඔක්තෝබර්	01	02	03	04	05	06	07	08	09	10	11	12	13	14	15	16	17	18	19	20	21	22	23	24	25	26	27	28	29	30	31	
ජුලි	08	09	10	11	12	13	14	15	16	17	18	19	20	21	22	23	24	25	26	27	28	29	30	31	01	02	03	04	05	06	07	අගෝස්තු
නොවැම්බර්	01	02	03	04	05	06	07	08	09	10	11	12	13	14	15	16	17	18	19	20	21	22	23	24	25	26	27	28	29	30		
අගෝස්තු	08	09	10	11	12	13	14	15	16	17	18	19	20	21	22	23	24	25	26	27	28	29	30	31	01	02	03	04	05	06		සැප්තැම්බර්
දෙසැම්බර්	01	02	03	04	05	06	07	08	09	10	11	12	13	14	15	16	17	18	19	20	21	22	23	24	25	26	27	28	29	30	31	
සැප්තැම්බර්	07	08	09	10	11	12	13	14	15	16	17	18	19	20	21	22	23	24	25	26	27	28	29	30	01	02	03	04	05	06	07	ඔක්තෝබර්

ඇමුණුම II

කිරි වැරූ නැම්බි වැස්සිය පෝෂණය කිරීම

සැලකිය යුතුයි

- මෙම සටහන සාමාන්‍ය නිර්දේශයක් පමණි. නැම්බියගේ වර්ගය, සත්ව පාලන ක්‍රමවේදය හා විශේෂයෙන්ම දෛනික බර වැඩි වීමට සාපේක්ෂව පෝෂණය සැපයීමට ආහාර සලාකය සකසා ගත යුතුය.
- ඔබගේ සතාට ගැලපෙන වඩාත් නිවැරදි ආහාර සලාකය ලබා ගැනීම සඳහා පශු වෛද්‍යවරයෙකු, සත්ව සංවර්ධන උපදේශකයෙකු හෝ සත්ව පෝෂණ වේදියෙකුගේ සහාය ලබා ගන්න.

වයසස		තෘණ	රනිලමය ශාක	සාන්ද්‍ර ආහාර	ඛණිජ මිශ්‍රණය
සිට	දක්වා	ප්‍රමාණය/ kg	ප්‍රමාණය/ kg	ප්‍රමාණය/ kg	ප්‍රමාණය/g
4 වැනි මස	6 වැනි මස අවසන	6	3	0.5	10
7 වැනි මස	9 වැනි මස අවසන	10	5	0.5	15
10 වැනි මස	12 වැනි මස අවසන	13	7	0.5	15
13 වැනි මස	15 වැනි මස අවසන	15	10	0.5	30
16 වැනි මස	18 වැනි මස අවසන	18	10	0.5	30
19 වැනි මස	21 වැනි මස අවසන	22	11	0.5	30
22 වැනි මස	24 වැනි මස අවසන	25	13	0.5	30
25 වැනි මස	30 වැනි මස අවසන	28	14	0.5	30

- පිරවූ මේස හැන්දක් ආසන්න වශයෙන් ග්‍රෑම් 15 ක් පමණ වේ.

ඇමුණුම III

දේහ තත්ව ලකුණු (Body Condition Scores/BCS)



(Adapted from A.J. Edmondson, I.J. Lean, C.O. Weaver, T. Farver and G. Webster. 1989. A body condition scoring chart for Holstein dairy cows. J. Dairy Sci. 72:68-78)

BCS 1

- වලිගය දෙපස කුහරය ඉතා හොඳින් කැපී පෙනේ.
- උකුල් අස්ථියේ ප්‍රසර උල් දැඩිව පෙනේ.
- කොන්දේ ඇට/කශේරුකා වෙන වෙනම දැඩිව පෙනේ.
- උරස් කුහරයේ ඇති පර්ශු (පපු ඇට) ඉතා හොඳින් කැපී පෙනේ
- පපු ඇට වෙන වෙනම ස්පර්ශ කළ හැක
- සමට යටින් මේද ස්ථරයක් නැත
- ගුද විවරය පිහිටි කුහරය ගිලී ගොස්ය
- බාහිර ලිංගේන්ද්‍රය ප්‍රමුඛව පෙනේ (පැති පෙනුම)

BCS 2

- වලිගය දෙපස කුහරය යන්තමින් පෙනේ
- උකුල් අස්ථියේ ප්‍රසර උල්ව පෙනේ
- කශේරුකා හා ඒවායේ මායිම් එතරම් හොඳින් නොපෙනේ
- පපු ඇට ඉතා හොඳින් කැපී පෙනේ
- සමට යටින් මේද ස්ථරයක් නැති තරම්ය
- ගුද විවරය පිහිටි කුහරය මද වශයෙන් ගිලී ගොස්ය
- බාහිර ලිංගේන්ද්‍රය එතරම් ප්‍රමුඛව නොපෙනේ

BCS 3

- වලිගය දෙපස කුහර නැත
- උකුල් අස්ථියේ ප්‍රසර රවුම් හැඩතිය
- කශේරුකා වෙන වෙනම නොපෙනේ. ඒ වටා මාංශ පේශී වැඩී ඇත
- පපු ඇට හොඳින් නොපෙනේ. තරමක පීඩනයක් යෙදීමෙන් පමණක් ඒවා ස්පර්ශ කළ හැක
- ගුද විවරය අසල කුහරයක් නොමැත
- සමට යටින් තරමක මේද තට්ටුවක් පවතී

BCS 4

- වලිගය දෙපස කුහර නැත. ඒවා පිරී ගොසිනි
- උකුල් අස්ථියේ ප්‍රසර ගෝලාකාරය
- කශේරුකා වෙන වෙනම නොපෙනේ. ඒ වටා මාංශ පේශීන් හොඳින් වැඩී ඇත
- දැඩි පීඩනයක් යෙදීමෙන් පමණක් පපු ඇට ස්පර්ශ කළ හැක
- සමට යටින් හොඳ මේද තට්ටුවක් ඇත

BCS 5

- දේහයේ පැහැදිළි කුහර නැත. ඒවා පිරී ගොස්ය
- උකුල් අස්ථියේ ප්‍රසර දැඩි ගෝලාකාර බවකින් යුක්තය.
- කශේරුකා වෙන වෙනම නොපෙනේ. මාංශ පේශීන්ගෙන් හා මේද ස්ථරයෙන් ඒවා වැසී ගොසිනි

- පපු ඇට ඝන මේද ස්ථරයකින් වැසී ඇත
- පාදයේ කලව ප්‍රදේශය රවුම්ව පිටතට නෙරා ඇත
- මෙවැනි දෙනුන් සාමාන්‍ය ගොවිපල වලදී දක්නට නොලැබෙන තරම්ය

ඇමුණුම IV

එළගවයින් සහ මී ගවයින්ගේ පණු හරණ සටහන

	පණු බෙහෙත් වර්ගය				
ගවයාගේ වයස	**ආසන්න බර-කි.ග්‍රෑම්**	**ඇල්සෝල් මි.ග්‍රෑම් : 1500 බෝලස්**	**ඇනල්ගන් මි.ග්‍රෑම් : 1500 මි.ග්‍රෑම් : 600**	**වොකසාන් මි.ග්‍රෑම් : 2400 බෝලස්**	**රින්ටාල් ග්‍රෑම් : 15 පැකට්**
එළ ගව පැටියා (මාස 01) මී ගව පැටියා (සති 02)	25-50 දක්වා 25-50 දක්වා	බෝලස් 1/2 බෝලස් 1/2	මි.ග්‍රෑම්. 600 බෝලස් 1 මි.ග්‍රෑම්. 600 බෝලස් 1	බෝලස් 1/4 - 1/2 දක්වා	ග්‍රෑම් 5 ක ප්‍රමාණය
මාස 03	50-100 දක්වා	බෝලස් 1/2	මි.ග්‍රෑම්. 1500 බෝලස් 1/2	බෝලස් 1/2	ග්‍රෑම් 10 ක ප්‍රමාණය
මාස 06	100-200 දක්වා	බෝලස් 1	මි.ග්‍රෑම්. 1500 බෝලස් 1	බෝලස් 1	ග්‍රෑම් 10-15 ක ප්‍රමාණය
මාස 09	200-300 දක්වා	බෝලස් 1-2	මි.ග්‍රෑම්. 1500 බෝලස් 1-2	බෝලස් 1	ග්‍රෑම් 15 ක පැකට් 1-2 දක්වා
මාස 12 ට වැඩි වැඩුණු ගවයෙකුට	300 ට වැඩි	බෝලස් 2	මි.ග්‍රෑම්. 1500 බෝලස් 2	බෝලස් 2-3	ග්‍රෑම් 15 ක පැකට් 2-3 දක්වා

- ඉහත සඳහන් පණු බෙහෙත් වර්ග වලින් එක් වර්ගයක් පමණක් එක් වතාවකට ඉහත සඳහන් ආකාරයට පාවිච්චි කරන්න.
- මී ගවයින් සඳහා පණු බෙහෙත් දීම වයස සති 2 දී ආරම්භ කරන්න.

- ඇනල්ගන් හා ඇල්සෝල් 100mg ක් ජීව බර 10kg කට වන පරිදි එනම්,

ඇනල්ගන් 600mg - 60kg දක්වා පැටවෙකුට එක බොලසයක්

ඇනල්ගන් 1500mg
ඇල්සෝල් 1500mg } - 150kg දක්වා සතෙකුට එක බොලසයක්

වොකසාන් 2400mg - 150kg දක්වා සතෙකුට එක බොලසයක්

හා වැඩිවන බරට ගැලපෙන පරිදි බෝලස ගණන තීරණය කරන්න.

- ඇනල්ගන්/ඇල්සෝල් හා වොකසාන් කිසි විටකත් කුඩුකර නොදෙන්න කෙසෙල් ගෙඩියක හෝ කොස් මදුලක සඟවා ගිලීමට සලස්වන්න.

නිවැරදි ලෙස පණු බෙහෙත් ලබා දීම

බෝලස් හෙවත් ලොකු පෙති ලෙස සකසා ඇති පණු බෙහෙත් කිසි විටෙක කුඩු කර පෙවීමෙන් වළකින්න.
උපරිම ප්‍රතිඵල සඳහා.

- නිවැරදි පණු බෙහෙත් වර්ගය (පශු වෛද්‍ය උපදෙස් අනුව)
- නිවැරදි මාත්‍රාවෙන් (සෑම විටම වැඩියෙන් දෙන්න. අඩුවෙන් දීමෙන් ප්‍රතිඵල නොලැබේ).
- නිවැරදි ආකාරයට ලබා දීමත්
- ගොවිපලෙහි සියළු සතුන් පණු හරණය කිරීමත් ඉතා වැදගත් වේ.

බෝලස් ආකාරයේ පෙති කෙසෙල් ගෙඩියක් තුළ හෝ කොස් මදුලක් තුළ සඟවා දීමෙන් සාර්ථක ලෙස පණු බෙහෙත් ලබා දිය හැක.

ඇමුණුම V

බේටිකෝල් ඊසී (Bayticol EC), ඇන්ටික් (Antick), ටිකමිට් (Tickamit) නිවැරදි භාවිතය

- පහත වගුවේ දැක්වෙන පරිදි නිවැරදි බෙහෙත් ප්‍රමාණය සිලින්ජරයකින් මැන ගන්න. මි.ලී 1 ක් යනු එක් බිංදුවක් නොවේ) එම ප්‍රමාණය අදාල ජලය ලීටර ප්‍රමාණයේ දියකරගන්න.
- ගවයාගේ දේහ බර 100kg ක් සඳහා සාදාගත් ද්‍රාවණයෙන් ලීටර 1 ක් අවශ්‍ය වේ.
- ඔබගේ ගවයාගේ දේහ බර කිලෝ ග්‍රෑම් 400 ක් නම් ද්‍රාවණයෙන් ලීටර 4 ක් අවශ්‍ය වේ.
- සාදාගත් ද්‍රාවණය භාවිතා කිරීමට පෙර ගවයා හොඳින් වියළි ස්වභාවයේ සිටිය යුතුය. නැතහොත් ශරීරයේ ඇති තෙතමනය නිසා බෙහෙතේ සැර බාල වේ.
- එසේම ගවයා පිරිසිදුව සිටීමද වැදගත් වේ. ගොම සහ මඩ නිසා බෙහෙත හොඳින් හමට වැදීම වැළකී යයි.
- දැන් ශරීරයේ ලොම් පිහිටි දිශාවට විරුද්ධ දිශාවට සාදාගත් ද්‍රාවණය ඇඟ ගල් වන්න. මේ සඳහා ස්ප්‍රේ කිරීම හෝ ස්පොන්ජ් කැබැල්ලකින් ගැල්වීම කළ හැකිය (ආරක්ෂක අත්වැසුම් පළඳින්න).
- කිනිතුල්ලන් බෝවන්නේ ශරීරයෙන් පිටතදී බැවින් නිතර ලඟින ස්ථාන /ගවගාලටත් සාදාගත් ද්‍රාවණයෙන් ඉසින්න.
- බෙහෙත් යෙදීමෙන් දින කිහිපයක් යනතුරු ගවයා නැහැවීමෙන් වළකින්න.
- නිවැරදි මාත්‍රාවෙන්, නිවැරදි ආකාරයට භාවිතා කිරීමෙන් උපරිම ප්‍රතිඵල ලැබෙන අතර නැවත භාවිතා කළ යුතු කාලාන්තරයද වැඩි කරගත හැක
- නිවැරදි නොවන ආකාරයට භාවිතා කිරීමෙන් උපරිම ප්‍රතිඵල නොලැබෙන අතර නිතර නිතර භාවිතා කිරීමට සිදු වීමෙන් මුදල් නාස්ති වේ.

කිනිතුළු නාශකය	ජලය 1L ක දියකළයුතු ml ප්‍රමාණය	ජලය 2L ක දියකළයුතු ml ප්‍රමාණය
Bayticol EC	0.5 ml	1 ml
Antick	1 ml	2 ml
Tickamit 12.5	2 ml	4 ml

බේටිකෝල් පෝ (ර්) ඕන් (Bayticol Pour On) නිවැරදි භාවිතය

- බේටිකෝල් පෝ(ර්) ඕන්/ කොන්ද දිගේ දමන කිනිතුලු නාශක බෙහෙතෙන් මිලි ලීටර එකක් ජීව බර 10kg කට පමණක් ප්‍රමාණවත් වේ.
- එනම් මිලි ලීටර 20 ක බෝතලයක් ප්‍රමාණවත් වන්නේ 200kg බර එක් සතෙකුට පමණි. එබැවින් ඔබගේ ගවයාගේ ජීව බරට අනුව අවශ්‍ය බෙහෙත් ප්‍රමාණය ලබා ගන්න. උදාහරණයක් ලෙස 350kg සතෙකුට මිලි ලීටර 35 ක් අවශ්‍ය වේ.
- ලබා දී ඇති සිරින්ජයට ලබා ගත හැක්කේ එකවර මිලි ලීටර 5 ක් පමණි. එබැවින් අවශ්‍ය බෙහෙත් ප්‍රමාණය ලබාගැනීමට කිහිප විටක් සිරින්ජය භාවිතා කිරීමට ඔබට සිදු වේ.
- බේටිකෝල් පෝ(ර්) ඕන් භාවිතයට පෙර ගවයා පිරිසිදුව හා වියළිව සිටිය යුතුය.
- හිස මුදුනේ සිට වලිගය මුදුන දක්වා කොන්ද දිගේ අඛණ්ඩ රේඛාවක් ලෙස බෙහෙත යොදන්න.
- බේටිකෝල් ඊසී මෙන් නොව බේටිකෝල් පෝ (ර්) ඕන් ජලයේ දිය නොවන බැවින් වැස්සෙන් තෙමීම හෝ පසු දින සිට නැහැවීමෙන් හානියක් නොවේ.

ඇමුණුම VI

පපුවේ වට ප්‍රමාණය දක්වා ඇති 04 රූප සටහනේ (පිටුව11) පරිදි මැන පහත වගුව භාවිතා කර එය කිලෝ ග්‍රෑම් බවට පත් කරන්න.

දිග (සෙ.මී.)	බර (කි.ග්‍රෑ.)
63	33
64	34
65	35
66	36
67	37
68	38
69	39
70	40
71	41
72	42
73	43
74	44
75	45
76	46
77	47
78	48
79	49
80	50
81	51
82	53
83	55
84	57
85	59
86	61
87	63
88	65
89	67
90	69

දිග (සෙ.මී.)	බර (කි.ග්‍රෑ.)
91	71
92	73
93	75
94	77
95	79
96	81
97	83
98	85
99	87
100	89
101	92
102	95
103	103
104	104
105	105
106	106
107	107
108	108
109	109
110	110
111	121
112	124
113	127
114	130
115	134
116	137
117	140
118	143

දිග (සෙ.මී.)	බර (කි.ග්‍රෑ.)
119	146
120	150
121	154
122	158
123	162
124	166
125	170
126	174
127	178
128	182
129	186
130	190
131	194
132	198
133	202
134	206
135	210
136	214
137	218
138	222
139	226
140	230
141	235
142	240
143	244
144	248
145	252
146	256

දිග (සෙ.මී.)	බර (කි.ග්‍රෑ.)
147	260
148	264
149	268
150	272
151	276
152	280
153	285
154	290
155	295
156	301
157	307
158	313
159	319
160	325
161	331
162	337
163	345
164	353
165	360
166	366
167	372
168	378
169	385
170	392
171	399
172	406
173	413
174	420

පපුවේ වට ප්‍රමාණය දක්වා ඇති 04 රූප සටහනේ (පිටුව11) පරිදි මැන පහත වගුව භාවිතා කර එය කිලෝ ග්‍රෑම් බවට පත් කරන්න.

දිග (සෙ.මී.)	බර (කි.ග්‍රෑ.)
175	427
176	435
177	443
178	451
179	459
180	467
181	475
182	483
183	491
184	499
185	508
186	516
187	525
188	534
189	543
190	552
191	561
192	570
193	579
194	588
195	598
196	608
197	618
198	628
199	638
200	648
199	638
200	648

දිග (සෙ.මී.)	බර (කි.ග්‍රෑ.)
201	658
202	668
203	678
204	688
205	698
206	708
207	718
208	728
209	738
210	748
211	758
212	768
213	778
214	788
215	798
216	808
217	818
218	828
219	839
220	850
221	861
222	872
223	883
224	894
225	905
226	916
227	928
228	941

දිග (සෙ.මී.)	බර (කි.ග්‍රෑ.)
229	955
230	969
231	684
232	1000

සටහන්

සටහන්

Provical

NUTRI-SACC

Coumaphos, Propoxur and
Sulfanilamide Powder (Vet)
Negasunt®
Dusting Powder

Bestmin

Hayleys
AGRICULTURE

සත්ත්ව සෞඛ්‍ය අංශය

හේලීස් ඇග්‍රිකල්චර් හෝල්ඩිංස් ලිමිටඩ්

නො. 25, ෆෝස්ටර් පටුමග, කොළඹ - 10.

දුරකථන: +94 11 2628200 ෆැක්ස්: +94 11 2697202